CSIAP

THE WORLD BANK

ඉහල යාංඔය එල්ලංගා පද්ධති කළමනාකරණ සැලැස්ම
යාංඔය ජලධාරා ප්‍රදේශය

ජනවාරි 2024

දේශගුණ සුහුරු වාරි කෘෂිකර්ම ව්‍යාපෘතිය

උතුරුමැද පලාත

<u>ඉදිරිපත් කිරීම</u>

ඉහල යාංඔය එල්ලංගා පද්ධති කලමනාකරණ කමිටුව

හිඟුරක්ගොඩ ප්‍රාදේශීය ලේකම් කොට්ඨාශය

පොලොන්නරුව

<u>අනුග්‍රහය</u>

ලෝක බැංකු මූල්‍ය ආධාර මත

කෘෂිකර්ම අමාත්‍යාංශය

දේශගුණ සුහුරු වාරි කෘෂිකර්ම ව්‍යාපෘතිය

උතුරු මැද පලාත් කාර්යාලය

අනුරාධපුර

උපදේශණය

ජ්‍යෙෂ්ඨ උපදේශක සරත් වික්‍රමරත්න - ලෝක බැංකුව

උතුරුමැද පලාත් නියෝජ්‍ය අධ්‍යක්ෂ එච්.එම්.පී.බංඩාර - CSIAP

දායකත්වය

ආයතන සංවර්ධණ හා හැකියා වර්ධන විශේෂඥ හා නියෝජ්‍ය අධ්‍යක්ෂ ආර්.පී.එම්.දිසානායක - CSIAP - දකුණු පලාත

ආයතන සංවර්ධණ හා හැකියා වර්ධන විශේෂඥ ඩී.වී.බන්දුලසේන CSIAP - ප්‍රධාන කාර්යාලය

සංස්කරණ දායකත්වය - උතුරුමැද පලාත් කාර්යාලය - CSIAP

කෘෂිකර්ම විශේෂඥ ජේ.ඒ.එන්.කේ.ජයසිංහ

ව්‍යාපෘති උපදේශණ ඉංජිනේරු පී.එච්.එස්.රන්ගිකා

පරිසර ආරක්ෂණ නිලධාරි ඩී.එච්.එම්.එස්.එස්.දිසානායක

ස්ත්‍රී පුරුෂ සමාජ භාවය සංවර්ධණ නිලධාරිනී එම්.ඒ.පී.ගුණසේකර

සමාජ ආරක්ෂණ නිලධාරිනී එම්.එම්.පී.එන්.දිල්රුක්ෂි

සහාය

කාර්යාල සහායක ර්.එම්.ජී.ඩී.ඒකනායක

සම්බන්ධීකරණය, සංස්කරණය හා ඉදිරිපත් කිරීම

ආයතන සංවර්ධණ හා හැකියා වර්ධන විශේෂඥ යු.අයි.රත්නායක CSIAP - උතුරු මැද පලාත

පිලිගැන්වීම

උතුරුමැද පලාතද ඇතුලුව පලාත් 6 ක ක්‍රියාත්මක වන දේශගුණ සුහුරු වාරි කෘෂිකර්ම ව්‍යාපෘතිය, ව්‍යාපෘති අරමුණු ශාක්ෂාත් කරගැනීමේ ක්‍රියාකාරකම් අතර එල්ලංගා පද්ධති කළමනාකරණය සඳහා ප්‍රවේශ වීමට ගන්නා උත්සහයේදී නියමු ව්‍යාපෘතියක් ලෙස ඉහල යාංඔය ගංගා ද්‍රෝණියේ මහසෙන්ගම හා මොරගස්වැව ග්‍රාම නිලධාරි කොට්ඨාශ දෙකට අදාල එල්ලංගාවේ 2023 අගෝස්තු 08 වන දින රාජ්‍ය නිලධාරීන් හා ගොවි නායකයින්ගේ සහභාගිත්වයෙන් එල්ලංගා පද්ධතියේ පවතින ගැටලු හඳුනාගැනීමට සංවිධානය වූ හරස්කඩ සංචාරයේදී එක්කාසු වූ නිරීක්ෂණයන් සහා එකතුකර ගත් ද්වීතියීක දත්තයන් පාදක කරගෙන මෙම සැලැස්ම සකස් කර ඇත.

මෙම සංචාරය සඳහා මාර්ග සිතියම සකස් කිරීමට ගොවි සංවිධාන සමග මූලික සාකච්චාවක් 2023 ජූලි 30 වනදා පැවති අතර ඉලක්ක ගත ප්‍රෙද්ශය ඉහල යාංඔය එල්ලංගාව ලෙස අප විසින් හඳුන්වාගෙන තිබුනත් මෙම පද්ධතිය එකිනෙකට වෙනස් වූ ගංගා ද්‍රෝණි දෙකක එල්ලංගාවන් බව තහවුරු විය. මේ අනුව ඉහල යාංඔය එල්ලංගාව සඳහා 2023 අගෝස්තු 08 වන දින කිරිඔය එල්ලංගාවේ හරස්කඩ සංචාරයට සමගාමීව ඉහල යාංඔය එල්ලංගාවේ හරස්කඩ සංචාරය සිදුවිය.

එල්ලංගා පද්ධතිය පිළිබඳව වියතුන් ගණනාවක් පර්යේෂණ කර ඇති අතර පර්යේෂණ නිබන්ධන ගණනාවක් එළිදක්වා ඇත. එහිදී එල්ලංගා පද්ධති කළමනාකරණය පිළිබඳව අවධානය යොමුකර ඇති අතර CSIA ව්‍යාපෘතියේ ප්‍රයත්නය වන්නේ එය යතාර්ථයක් වන පරිදි ක්‍රියාත්මක තලයට ගෙන ඒමයි. එහි තීරණාත්මක ප්‍රෙවිශයක් වනුයේ ගොවි ජන සංවර්ධන පනතේ සංශෝධනයක් මගින් එල්ලංගා පද්ධති කළමනාකරණ කමිටුව නීතීමය පදනමක් සහිතව ස්ථාපිත කිරීමයි.

මෙම ප්‍රෙවිශයේ ප්‍රමුඛ ගෞරවය හිමිවිය යුත්තේ මෙතෙක් එල්ලංගා පද්ධති පිළිබඳව පර්යේෂණයන් සිදුකල සියලුම විද්වතුන් හා පර්යේෂකයන්ටය. එමෙන්ම මෙම ව්‍යාපෘතිය එල්ලංගා පද්ධති කළමනාකරණය දෙසට කේන්ද්‍රගත කරමින් ඒ සඳහා මග පෙන්වමින් උපදේශණය ලබාදෙන ලෝක බැංකුවේ උපදේශක සරත් වික්‍රමරත්න මහතා ඇතුලු නිලධාරීන්ට සහා ව්‍යාපෘති අධ්‍යක්ෂ ඉංජිනේරු ආර් එම් බී රාජකරුණා මහතා ප්‍රධාන ව්‍යාපෘති කාර්ය මණ්ඩලයටත් විශේෂයෙන් උතුරුමැද පලාත් ව්‍යාපෘති කාර්යාලයේ නියෝජ්‍ය අධ්‍යක්ෂ එච්.එම්.පී බංඩාර මහතා ඇතුලුව සහෝදර නිලධාරීන්ටත්, මේ සඳහා සහාය ලබාදුන් හිඟුරක්ගොඩ ප්‍රාදේශීය ලේකම්තුමා ප්‍රධාන සියලුම රාජ්‍ය ආයතන හා නිලධාරීන්ටත්, තිඹිරිගස්වැව, මොරගස්වැව හා කඩහතවැව ගොවි සංවිධාන සහා නිෂ්පාදන සමිති නිලධාරීන් සහා සාමාජිකයින් සියලු දෙනාටම ස්තූතිය හා ප්‍රණාමය පිරිනමමි.

යූ.අයි.රත්නායක

ආයතන සංවර්ධන හා හැකියා වර්ධන විශේෂඥ - උතුරු මැද පලාත

දේශගුණ සුහුරු වාරි කෘෂිකර්ම ව්‍යාපෘතිය

පටුන

1. හැඳින්වීම 7

1.1 එල්ලංගා සහ එල්ලංගා පද්ධති කළමනාකරණය අර්ථ දැක්වීම. 8

1.2 එල්ලංගා පද්ධතිය පිළිබඳ කෙටි හැඳින්වීම සහ එල්ලංගා පද්ධතියේ අවශ්‍යතාව 10

1.3 ඉහල යාංඔය හා කිරිඔය එල්ලංගාවේ සිතියම් Map of Cascades **13**

1.4 ඉහල යාංඔය එල්ලංගාව පිළිබඳ තොරතුරු 16

1.5 ඉඩම් පරිහරණ රටාව - Land Use Pattern 19

1.6 එල්ලංගාවේ වැව්වල විස්තර - Tank Details of Cascade 19

2. එල්ලංගා පද්ධති පැතිකඩ සකස් කිරීම

2.1 එල්ලංගා පද්ධති පැතිකඩෙහි අරමුණු 20

2.2 **එල්ලංගා පද්ධති පැතිකඩ සකස් කිරීමේ ක්‍රමවේදය 20**

3. එල්ලංගා පද්ධතිය දැනට මුහුණ දෙන ගැටළු

3.1 **භූගෝලීය විස්තර 22**

3.2 භූ විද්‍යාත්මක විස්තර 23

3.3 ජලවිද්‍යාත්මක තොරතුරු Hydrological Details 23

3.4 පුරාණ එල්ලංගා පද්ධතියේ වර්ගමාන තත්වය 25

3.5 වන සම්පත් භාවිතය නිසා පාරිසරික ගැටළු වල ප්‍රබලත්වය හා ජන ජීවිතයේ පැවැත්මට එහි ඇති බලපෑම 25

3.6 සමාජ ආර්ථික ගැටළු 25

3.7 එල්ලංගා පද්ධතිය තුළ දැනටමත් සිදුවන ඉදිකිරීම් කටයුතු 26

3.8 එල්ලංගාවේ කුඹුරු හා ගොඩ ඉඩම් වල වගා රටාව 26

3.9 පරිසර විද්‍යාත්මක තොරතුරු 26

3.10 ජල පෝෂක ප්‍රදේශ වන පවතින ගැටළු 28

4. එල්ලංගා පද්ධති කළමනාකරණය

4.1 **එල්ලංගා කළමනාකරණ කමිටුවක අවශ්‍යතාවය 31**

4.2 **එල්ලංගා පද්ධති කළමනාකරණ කමිටු පිහිටුවීම 31**

4.3 **එල්ලංගාව කළමනාකරණ සැලැස්ම සකස් කිරීමේ අනුගමනය කරන ලද ක්‍රමවේදය** 33

4.4 එල්ලංගා පද්ධති කළමනාකරණ සැලැස්ම සකස් කිරීම 35

4.5 ඉහල යාංඔය එල්ලංගාව මුහුනදෙන ප්‍රධාන අභියෝගයන් 36

5. එල්ලංගාව මුහුණ දෙන ප්‍රධාන ගැටළු 38

6. එල්ලංගා පද්ධති කළමනාකරණ සැලැස්ම

6.1 **මූලික පරමාර්ථ** **39**

6.2 **එල්ලංගා පද්ධති කළමණාකරණ සැලැස්ම** **39**

6.3 ඉහල යාංඔය **එල්ලාංගා පද්ධතියේ කෘෂිකර්ම සැලැස්ම** **43**

6.4 **එල්ලංගා පද්ධති කළමනාකරණ කමිටු සැලැස්මේ හඳුනා ගත් ගැටළු සහ සමාජ ආරක්ෂණ මැදිහත් වීම** **46**

6.5 **එල්ලංගා පද්ධති කළමනාකරණ සැලැස්ම** **47**

6.6 එල්ලංගා කළමනාකරණ සැලැස්ම ක්‍රියාත්මක කරන ආකාරය 48

6.7 **එල්ලංගා පද්ධති කළමනාකරණ සැලැස්ම ක්‍රියාත්මක කිරීමේ කාලරාමුව** **49**

6.8 **එල්ලංගා පද්ධතියේ පාරිසරික සැලැස්ම ක්‍රියාත්මක කිරීමේ කාලරාමුව** **51**

7. ජල කළමනාකණය 53

8. සැලැස්ම මගින් අරමුණු ඉටුවේද යන්න ඇගයීම

8.1 ප්‍රධාන කාර්ය සාධක - KPI 53

8.2 නිශ්චිත සංධිස්තාන - Mmilestone 54

9. ඇමුණුම්

1. 2023.08.03 දිනැති අංක 6/ 2023 දරන චක්‍ර ලේඛය 55
2. එල්ලංගා පද්ධති කළමනාකරණ කමිටු පිහිටුවීම පිළිබඳ කෘෂිකර්ම අමාත්‍යාංශ ලේකම් විසින් නිකුත් කල ලිපිය 61
3. උප ව්‍යාපෘති යෝජනා ආකෘතිය 63

FOREST DEPARTMENT
2023.08.07

1. හැඳින්වීම

ඓතිහාසික පසුබිම

පැරණි පදිංචිකරුවන් මූලික වශයෙන් ගංවතුර තැනිතලා සහ ඒ ආශ්‍රිත සම්පත් වැනි තෙත්බිම් පරිසර පද්ධති මත රඳා පැවතුනි. ඔවුන් ගංවතුර තැනිතලා සහ ගංගා ආශ්‍රිත වාසස්ථාන ආශ්‍රිතව තම ජනාවාස පිහිටුවා සංවර්ධනය කළහ. ශ්‍රී ලංකාවේ වියළි කලාපයේ දක්නට ලැබෙන බොහෝ ගංගා සහ ඇළ දොළ සෘතුමය වන අතර ඒවායේ ප්‍රවාහය රඳා පවතින්නේ ලැබෙන වර්ෂාපතන ප්‍රමාණය මතය. සෘතුමය හෝ බහු වාර්ෂික ඇළ හරහා පස් බැම්මක් හෝ වේල්ලක් ඉදිකිරීමෙන් වාරි වැව් නිර්මාණය කරන ලදී. එවිට ඇළෙන් ගලා යන ජලයෙන් වැව පුරවනු ලැබේ.

එකතු කරන ජලය ගබඩා කර ගමේ වාරිමාර්ග, ගෘහ හා අනෙකුත් අවශ්‍යතා සඳහා යොදා ගැනේ. වාරි වැව් නිර්මාණය කිරීම නිසා ඇළ දොළ තවදුරටත් ගලා නොයන විට පවා ගම්වලට ප්‍රමාණවත් තරම් ජලය ගබඩා කර තබා ගැනීමට හැකි විය. එබැවින් වැව් කඳුරැල්ල පද්ධතිය 'වර්ෂාපතන රටාවන්ට මානව අනුවර්තනයක්' ලෙස විස්තර කළ හැක (Someratne et al., 2005).

වාරිමාර්ග සඳහා ජලය ලබා ගැනීමේ මෙම වැඩිවීම නිසා වාර්ෂිකව කන්න දෙකක් වගා කිරීමට හැකි විය. උතුරු මැද වියළි පහත් බිම්වල පරිසර විද්‍යාව වෙනස් කරමින් පුරාණ අනුරාධපුර (ක්‍රි.පූ. 437-ක්‍රි.ව. 845) සහ පොළොන්නරුව (ක්‍රි.ව. 846-ක්‍රි.ව. 1302) ආදී රාජධානිවල වැසි ජලය රැස් කිරීමේ ජලාශ සහ වැව් සංවර්ධනය කරන ලදී.

මේ වන විට, ශ්‍රී ලංකාවේ මිනිසා විසින් සාදන ලද දහස් ගණනක් සහිත වැව් දහස් ගණනක් සමඟින්, උතුරු මැද පළාතේ පමණක් ජලාශ 10,000 කට අධික සංඛ්‍යාවක් සමඟින් ආසන්න වශයෙන් පැරණි කුඩා වේලි 12,000 ක් සහ පුරාණ විශාල වේලි 320 ක් ඇත. වැව් ස්වභාවිකකරණය වී ඇත. මෙයින් අදහස් කරන්නේ මෙම වැව් සහ ජලාශ මිනිසුන් විසින් පිහිටුවන ලද නමුත් කාලයත් සමඟ ඒවා ඔවුන්ගේ වටපිටාව සමඟ ඒකාබද්ධ වී දැන් භූ දර්ශනයේ කොටසක් බවට පත්ව ඇති බවයි. වැව් සහ ජලාශ විශේෂ සහ වාසස්ථානවල පොහොසත් විවිධත්වයකට සහාය වේ.

(සටහන්: පහත ලිපියේ පරිවර්තණයකි)

Historical Background

Ancient settlers depended primarily on wetland ecosystems such as flood plains and associated resources. They established and developed their settlements along flood plains and riverine habitats. Most rivers and streams found in the dry zone of Sri Lanka are seasonal, and their flow is dependent on the amount of rainfall received. Irrigation tanks were created by constructing an earth bund or dam across a seasonal or perennial stream. The tank is then filled with water that flows from the stream.

The water collected is stored and used for irrigation, domestic and other needs of the village. The creation of irrigation tanks allowed villages to almost always have a sufficient amount of stored water for use, even when the streams were no longer flowing. The tank cascade system can therefore be described as a 'human adaptation to rainfall patterns' (Someratne et al., 2005). This increase in water availability for irrigation made two seasons of annual cultivation possible. Rainwater harvesting reservoirs and tanks were developed in the ancient kingdoms of Anuradhapura (437 BC-845 AD) and Polonnaruwa (846 AD-1302 AD), changing the ecology of the north central dry lowlands.

At present, there are approximately 12,000 ancient small dams and 320 ancient large dams, together with thousands of man-made lakes in Sri Lanka, with over 10,000 reservoirs in the Northern Province alone. The tanks have become naturalized. This means that although these tanks and reservoirs were established by people, over time, they have become integrated with their surroundings and are now a part of the landscape. Tanks and reservoirs support a rich diversity of species and habitats.

Source: Someratne et al. (2005).

1.1 එල්ලංගා සහ එල්ලංගා පද්ධති කළමනාකරණය අර්ථ දැක්වීම.

එල්ලංගා පද්ධතියක් යනු ශ්‍රී ලංකාවේ වියළි කලාපයේ ක්ෂුද්‍ර ජල පෝෂක ප්‍රදේශයක් තුළ සංවිධානය කරන ලද සම්බන්ධිත වැව් මාලාවකි. ඍතුමය දිය පහරකින් ජලය ගබඩා කිරීම සඳහා වැව් භාවිතා වේ. ගබඩා කර ඇති ජලය පහළට ඇති අනෙකුත් වැව් වෙත ගෙන යන අතර විවිධ අරමුණු සඳහා භාවිතා වේ.

වාරි වැව් බොහෝ විට හුදකලා වැව් නොවන අතර ඒවා විශාල අන්තර් සම්බන්ධිත වැව් පද්ධතියක කොටසක් වන අතර එය 'වැව් කඳුරැල්ල පද්ධතිය' ලෙස හැඳින්වේ. එය ක්ෂුද්‍ර ජල පෝෂකයක් තුළ සංවිධානය කර ඇති වැව් මාලාවක් සමඟ සම්බන්ධ වී ඇත. ' එල්ලංගා පද්ධතියක්' යනු වැව් කළමනාකරණයේදී භාවිත වන සාම්ප්‍රදායික ඒකකයයි. ඈත අතීතයේ සිට එය හැඳින්වෙන්නේ 'එල්ලංගාව' යනුවෙනි. මෙම පදය සෑදී ඇත්තේ එකකට පසු එකක් යන අර්ථය ඇති එල්ලන සහ 'ගාවා' යන අර්ථය ඇති 'එල්ලන්' යන සිංහල වචන වලින්ය.

මූලාශ්‍ර: මද්දුම බණ්ඩාර, 1985; පානබොක්කේ (2001)

සම්ප්‍රදායික එල්ලංගාව තුළ අරමුණු කීපයක් අරඹයා වැව් නම් කර ඇත. මේ පිළිබඳව ආචාර්ය ධර්මසේන (2010), ආචාර්ය සේනානායක (2010) සහ ආචාර්ය සෝමරත්න (2005) යන අයගේ නිර්වචනයන්ට අනුව පහත පරිදි විස්තර කර ඇත.

• **කුළු වැව (වන වැව):**

වන සතුන් සඳහා ජලය සැපයීම, සුන්බුන් සහ රොන්මඩ පෙරීම සහ පිටාර ගැලීම හරහා ගමේ වැවට ඇතුළු වන වැසි ජලය අල්ලා ගැනීම සඳහා ගමේ ඉහළ ජල පෝෂක ප්‍රදේශයේ ඉදිකර ඇත. වන සතුන්ට ජලය ලබා දීමෙන් මෙම වනාන්තර වැව් මඟින් ජලය සොයා ගමට පැමිණ වගාවන්ට හානි කිරීමේ සම්භාවිතාව අඩු කරයි.

• **කායන් වැව:**

ඉහළ ජල පෝෂක ප්‍රදේශය එළිපෙහෙළි කර හෝ දිරාපත් වූ තැන ඉදිකර ඇත. එය අවසාදිත උගුලට හසු කර ගැනීමට සහ ලවණතාව පාලනය කිරීමට භාවිතා කරයි.

• **ඔලගම් වැව:**

ගමට ආසන්නව පිහිටා ඇත, නමුත් ස්ථිර ජනාවාසයක් හෝ වගාවක් සමඟ සම්බන්ධ නොවේ. එය සෘතුමය වගාව සඳහා ජල මූලාශ්‍රයක් ලෙස භාවිතා කරයි.

• **ගොඩ වල (ජල කුහරය):**

ප්‍රධාන ගමේ වැවේ රොන්මඩ හා අවසාදිත වීම වළක්වා ගැනීම සඳහා රොන්මඩ උගුලට හසු කර වූවවූ

• **ඉහළ වැව (ගබඩා වැව):**

ජලය ගබඩා කිරීම සඳහා ඉදිකරන ලද අතර, වී වගාව සහ අනෙකුත් ප්‍රජා ක්‍රියාකාරකම් හා සම්බන්ධ වේ.

වැව් පුනරුත්ථාපන වැඩසටහනේ තිරසාර බව සුරක්ෂිත කිරීම සඳහා එල්ලංගා පද්ධති කළමනාකරණය කිරීමට CSIAP සැලසුම් කරයි. පුරාණ කාලයේ සිට ප්‍රතිලාභීන් තිරසාර බව පවත්වා ගැනීම සඳහා කඳුරැල්ල ආරක්ෂා කරයි. වගා කන්නය අවසන් වූවට පසුව වැවට ඒක්කාසු වූ ගොවීන් කිරි ඉතිරීමේ මංගල්‍යක් කර වැව් තැනූ මී මුත්තන්ට පිං දී කළගුණ සැලකුවා සේම ගම් ප්‍රධානියා විසින් සෑම පවුලකටම රොන්මඩ ඉවත් කිරීම සඳහා වැව තුල (වැව් පිටියේ) කොටසක් වෙන්කල අතර එය කට්ටි කැපීම ලෙස ව්‍යවහාර කල අතර එසේ ඉවත්කරන රොන්මඩ වැව් බැම්ම ශක්තිමත් කිරීමට යොදාගැනීම සංස්කෘතියේ අංගයක් විය.

නමුත් 1970 ගණන්වල රජය මැදිහත් වී ඉහත කාර්යයන් කිරීම වෙනුවෙන් ගොවීන්ට වියළි ආහාර ද්‍රව්‍ය ලබා දුන්නේය. ගොවීන් තම වගකීම අතහැර ආහාර ද්‍රව්‍ය ලබා ගැනීම සඳහා වැවේ වැඩ කළහ. වසර කිහිපයකට පසු රජය සහනාධාර වැඩසටහන නතර කළ අතර ගොවීන්ට ඔවුන්ගේ වගකීම අමතක විය. ඒතැන් සිට වැව නඩත්තු කිරීම වැව පරිහරණය කරන ගොවීන්ගේ වගකීමක් වෙනුවට රාජ්‍ය මැදිහත්වීමක් හරහා වියයුත්තක් බවට මතවාදය වෙනස් විය.

මෙම තත්වය යහපත් දිශාවට හැරවීම අරමුණු කර ගනිමින් එල්ලංගාව, පද්ධතියක් ලෙස කළමනාකරණය කිරීම ගොවීන් ගේ හෝ රාජ්‍යයේ පමනක් වගකීමක් යන හුදු සංකල්පයෙන් ඔබ්බට එය ප්‍රක්ෂේපණය කිරීමට ගොවි සංවිධාන (FO), ප්‍රජාමූල සංවිධාන (CBO), ප්‍රතිලාභීන් සහ අදාළ රාජ්‍ය නිලධාරීන් ඇතුළු සියලුම පාර්ශවකරුවන් එක්කාසු කරමින් එල්ලංගා පද්ධති කළමනාකරණ කමිටුවක් (CMC) පිහිටුවීමට අවශ්‍ය බවත් එල්ලංගාවේ තිරසාර පැවැත්ම සඳහා එය අනිවාර්ය සංවිධාන ව්‍යුහයක් බව CSIA ව්‍යාපෘතිය හඳුනාගෙන ඇත.

1.2 එල්ලංගා පද්ධතිය පිළිබඳ කෙටි හැඳින්වීම සහ එල්ලංගා පද්ධතියේ අවශ්‍යතාවය.

එල්ලංගා පද්ධතිය (එල්ලංගාව) යනු නවීන හා විශිෂ්ට ජල කළමනාකරණ ක්‍රමවේදයක් වන අතර එය වැසි ජලය ගබඩා කිරීම සහ බෙදා හැරීම, ජල සුරක්ෂිතභාවය සහ අභ්‍යන්තර ජල මූලාශ්‍ර පොහොසත් කිරීම සක්‍රීය කරයි.

එල්ලංගාව නොහොත් එල්ලංගා පද්ධතිය සමන්විත වන්නේ වාරිමාර්ග ඇල ජාලයක් හෝ ස්වාභාවික ජල ප්‍රවාහ මාර්ගයක් සමඟ අන්තර් සම්බන්ධිත කුඩා වැව් සමූහයකිනි. ශ්‍රී ලංකාවේ වියළි කලාපයට ඉතා සුදුසු මෙම පෞරාණික වාරි තාක්ෂණය 2018 අප්‍රේල් 19 දින සිට එක්සත් ජාතීන්ගේ ආහාර හා කෘෂිකර්ම සංවිධානය විසින් ලෝක කෘෂිකාර්මික උරුමයක් ලෙස ප්‍රකාශයට පත් කර ඇත. ක්‍රියාකාරී කුඩා වැව් 14,500 ක් පමණ ඇති අතර ඉන් සියයට 80 ක්ම එහි කොටසකි. එල්ලංගා පද්ධති එක්දහස් දෙසිය හැට දෙකක් හඳුනාගෙන ඇත.

පොලොන්නරුව දිස්ත්‍රික්කයේ වැව් 24 ක් පුනරුත්ථාපනය සඳහා CSIA ව්‍යාපෘතිය සැලසුම් කර තිබූ අතර එය යාන්ඔය සහා අලුත්ඔය ගංගා ද්‍රෝණියන්ට අයත්ය.

පොලොන්නරුව CSIA ව්‍යාපෘති බල ප්‍රදේශය වෙනුවෙන් සකස් කෙරුණු සංවර්ධන සැනැස්මේ පවා ඉහල යාංඔය ලෙස නම් කර තිබූ මෙම කොටස ගංගා ද්‍රෝණි දෙකක එල්ලංගා පද්ධති තුනක් ලෙස හරස්කඩ සංචාරයට සමගාමීව මාර්ග සැලැස්ම සකස් කිරීම සඳහා කරන ලද පූර්ව සාකච්චාවේදී තහවුරු විය.

ඒ අනුව දැනට පුනරුත්ථාපන කටයුතු සිදුවෙමින් පවතින වැව් 10 පහත පරිදි වේ.

යාංඔය ගංගා ද්‍රෝණිය - ඉහල යාංඔය එල්ලංගාව - වැව් පද්ධතිය - දෙහිඅත්තාවල, උණගොල්ලෑව, මොරගස්වැව, තිඹිරිගස්වැව හා කඩහතවැව

මින්නේරිය ඔය ගංගා ද්‍රෝණිය - කිරිඔය එල්ලංගාව - අඟුලාන, පුරාණ ඉලුක්වැව හා ගලින්ද කුඩාවැව

මින්නේරිය ඔය ගංගා ද්‍රෝණිය - ඊරිගේඔය එල්ලංගාව - නිකපිටිය හා ගලෙන්බිඳුනුවැව

දිස්ත්‍රික්කයේ සිතියම

District Map

හිඟුරක්ගොඩ ප්‍රාදේශීය ලේකම් කොට්ඨාශයේ සිතියම



1.3 ඉහළ යාන්ඔය හා කිරිඔය එල්ලංගා පද්ධතියේ සිතියම



ඉහල යාංඔය එල්ලංගා පද්ධතිය


Ihala Yanoya Cascade
N
W
E
S
Thimbirigaswewa
Kadahathawewa
Moragaswewa
Dehiaththawala
Unagollewa
1
0.5
0
1 Kilometers

1.4 ඉහල යාංඔය එල්ලංගාව පිළිබඳ තොරතුරු Details of Upper Yanoya Cascade

පොලොන්නරුව හිඟුරක්ගොඩ ප්‍රාදේශීය ලේකම් කොට්ඨාශයේ මොරගස්වැව ග්‍රාමනිලධාරි කොට්ඨාශය පුරා විහිදී ඇති මෙම එල්ලංගාව වන ජීවි අධිරක්ෂිත කලාපයකින් හා වන සංරක්ෂන කලාපයට මායිම් වු පාරිසරික වශයෙන් වැදගත් වු ජෛව විද්‍යාත්මක වටිනාකමක් සහිත භූමි භාගයකි. හබරණ - පොලොන්නරුව හා හබරණ - ත්‍රිකුණාමලය මාර්ගයන් මැදි කරගෙන සහා කවුඩුල්ල මෙන්ම මින්නේරිය ජාතික වන උද්‍යානයට මායිම්ව පිහිටි ශ්‍රී ලංකාවේ ප්‍රමුඛ සංචාරක කලාපයක කේන්ද්‍රෙය් මෙම එල්ලංගාව පිහිටා ඇත. එපමනක්ද නොව ලෝක උරුමයක් වන ෛඑතිහාසික සීගිරිය මෙම එල්ලංගාවේ සිට කිමී 10 පමන නුදුරින් පිහිටීම දෙස් විදෙස් සංචාරකයින්ගේ අවධානය මෙම එල්ලංගාව වෙත ලබාගැනීමේ ඉඩ කඩද පවතී. මෙම එල්ලංගාවේ තිඹිරිගස්වැව බැම්ම මතින් දිවෙන මාර්ගය කවුඩුලු වැව වන උද්‍යානයට එක් ප්‍රෙවිශ මාර්ගයක් වීමද සාධනීය කාරණයකි.

මෙම එල්ලංගාව පිළිබඳ දත්ත කීපයක් පහත වගුවේ දැක්වේ.

1.4.1 General Information

Information	Details
Name of the District	Polonnaruwa
Name of the Divisional Secretariat/s	Hingurakgoda
Name of the electorate	Minneriya
Name of the river basin	Yan Oya
Name of the Cascade:	ඉහල යාංඔය එල්ලංගාව
Name of the Agrarian Development Center/s.	Hingurakgoda

Name/s of Grama Niladari Division/s	Moragaswewa
Extent of the cascade in hectares	2892
Number of sub watersheds	1
Number of clear catchments	06
Number tanks used for agriculture	05
Restricted forest areas, if any	Yes
Number of families living in the command area	172
Number of tanks located within the forest	01

1.4.2 Demographics of Upper Yanoya Cascades – Population Distribution

ASC	Thulana (GN Division)	Area (Km^2)	No. of villages	No. of families	Population			
					Total	Males	Females	Density Popu/sqkm
Hingurakgoda	Moragaswewa	75.8	5	635	2858	1288	1570	37.70

Percentage: Male 45.06%, Female 54.94%

Resource Website of Divisional Secretariat at Hingurakgoda





Number of Males employed in various sectors

GN Division		State Sector		Private Sector		Agriculture		Non Agriculture		Lobour		Total
ID	Name	Num	%	Num	%	Num	%	Num	%	Num	%	
29	Moragaswewa	131	18.1	122	16.9	253	35.2	73	10.1	143	19.8	722
30	Mahasengama	35	13.6	47	18.4	138	53.9	11	4.3	25	9.8	256

Resource Profile DS/Hingurakgoda (HSAADP)

1.5 Land Use Pattern

Number of Agro-wells and possible extent for Yala Cultivation

GN Division		Number of Agro-wells		Possible extent for Yala ha	Number of Beneficiaries
ID	Name	In use	Abandoned		
29	Moragaswewa	00	00	00	00
30	Mahasengama	39	00	42	69

Resource Profile DS/Hingurakgoda (HSAADP)

1.6 Tank Details of Cascade

ඒල්ලංගාවේ වැව් වල මූලික තොරතුරු **Basic Information of Tanks**

Tank No/Name	Capa city ha m	Command Area ha		Number of farm Familie	Land Ownership ha		Rehab ilitatio n
		Present	Future		Aver age	Range	
29 Moragaswewa GN Division							
Dehiakkawala wewa		08.0	08.0	40	0.18	0.5 – 0.1	Y
Unagollawa wewa		11.0	11.0	22	0.50	0.5-0.25	Y
Moragas wewa		22.6	22.6	63	0.35	2.4 - 0.1	Y
Thimbirigas wewa		16	16.0	38	0.42	1 - 0.1	Y
Kadahatha wewa		18.8	18.8	45	0.42	0.8 - 0.1	Y
30 Mahasengama GN Division							
Galenbindunu wewa		30	30.0	34	0.88	1 - 0.5	Y
Purana wewa		15	15.0	35	0.43	1.2 - 0.1	Y
Galinda Maha wewa		42.0	42.0	39	1.08	2.4 - 0.6	N
Angulan wewa		24.8	40.8	17	1.46	1 0.2	Y
Gallinda Kuda wewa		15.0	15.0	7	2.14	2.5- 0.6	Y
Nikapitiya wewa		38.0	38.0	43	0.88	1 - 0.5	Y

Resource Profile DS/Hingurakgoda (HSAADP)

2.එල්ලංගා පද්ධති පැතිකඩ සකස් කිරීම

2.1 එල්ලංගා පද්ධති පැතිකඩෙහි අරමුණු

2.1.1 කළමනාකරණ සැලැස්මක් සකස් කිරීමට දත්ත එක්කාසු කිරීම.

2.1.2 එල්ලංගාව ආරක්ෂාකිරිම සාමුහික ප්‍රයත්නයක් වියයුතු බව තහවුරු කිරීම.

2.1.3 එල්ලංගාවේ පවතින ගැටලු අදාල සියලු පාර්ශවයන්ගේ දායකත්වයෙන් හඳුනාගැනීම, පුමුඛතා ගත කිරීම හා ඊට විසඳුම් සාමුහිකව සෙවීමට ප්‍රෙවිශයක් ලබාගැනීම.

2.1.4 එල්ලංගාව කළමනාකරණයට පාර්ශව කරුවන් ප්‍රෙවිශවන විට එම පද්ධතිය පිළිබඳව සියැසින් දැක තිබීම එලදායි වීම.

2.2 එල්ලංගා පද්ධති පැතිකඩ සකස් කිරීමේ ක්‍රමවේදය

මෙම වැඩසටහන යටතේ එල්ලංගා පද්ධති කළමනාකරණය කරන්නේ නම්, අපි එක් එක් එල්ලංගා පද්ධතියේ දත්ත, හඳුනාගත් සම්පත්, පවතින ගැටළු එකතු කළ යුතුය. ඊට පසු අපි ප්‍රාථමික දත්ත සහ ද්විතියික දත්ත විශ්ලේෂණය කරමින් එල්ලංගා පද්ධති පැතිකඩ සකස් කිරීම සිදු කරයි.

ද්විතීයික දත්ත රැස් කිරීම සඳහා, "සම්පත් පැතිකඩ" හිඟුරක්ගොඩ ප්‍රාදේශීය ලේකම් කාර්යාලයේ අදාළ මූලාශ්‍රය, පොහොර ලියාපදිංචි කිරීමේ ලැයිස්තුව සහ ගොවිජන සේවා මධ්‍යස්ථානය - හිඟුරක්ගොඩ, බල ප්‍රදේශයේ කෘෂිකර්ම සංවර්ධන සැලැස්ම, ඉංජිනේරු සමීක්ෂණය, ජල විද්‍යා සමීක්ෂණ සහ අන්තර්ජාලය ද ඩිජිටල් සාහිත්‍යයද භාවිතා කරන ලදී.

ප්‍රාථමික දත්ත රැස් කිරීම සඳහා හරස්කඩ සංචාරයක් සංවිධානය කරන ලදී. ඒ සඳහා අපි එල්ලංගා පද්ධති කළමනාකරණ කමිටු සාමාජිකයින් වන ගොවීන්ට රාජ්‍ය නිලධාරීන්ට ඇතුලු සියලුම පාර්ශවකරුවන්ට කිරිඔය එල්ලංගා පද්ධතියේ ඉහළ සිට පහළට සමීක්ෂණය සඳහා ආරාධනා කරන ලදී.

හරස්කඩ චාරිකාව

හරස්කඩ චාරිකාව සංවිධානය කරන ලද්දේ 2023 අගෝස්තු 08 වැනිදාය.

2023 ජූලි 30 වැනි දින පෙර සූදානම් කිරීමේ රැස්වීමේදී ගොවි නායකයන් විසින් මාර්ගය තීරණය කරන ලදී. ඔවුන් කණ්ඩායම්වලට මඟ පෙන්වූහ. GDO පහසුකම් සපයන්නෙකු ලෙස සහභාගී වූ අතර සුභසාධනය පිළිබඳ වගකීම භාර ගත්තේය.

හරස්කඩ සංචාරයේ ප්‍රධා න පරමාර්ථය වූයේ ප්‍රාථමික දත්ත රැස් කිරීම, මුළු එල්ලංගා පද්ධතියම නිරීක්ෂණය කිරීම, එල්ලංගාවේ ගැටළු සහ සම්පත් හඳුනා ගැනීම සඳහාය.

මෙම අවස්ථාවට ගොවි නායකයින් ප්‍රධාන ගොවීන් 40 දෙනෙකු පමණ සහභාගී විය. තවද, ප්‍රාදේශීය ලේකම් කාර්යාලය, වන සංරක්ෂණ දෙපාර්තමේන්තුව, වනජීවී දෙපාර්තමේන්තුව, පුරාවිද්‍යා දෙපාර්තමේන්තුව, ගොවිජන සංවර්ධන දෙපාර්තමේන්තුව, සත්ව පාලන දෙපාර්තමේන්තුව, කෘෂිකර්ම දෙපාර්තමේන්තුව, වාරිමාර්ග දෙපාර්තමේන්තුව, පශු සම්පත් දෙපාර්තමේන්තුව යන ආයතනවල නියෝජිතයන් සහ සමෘද්ධි නිලධාරීන්, ග්‍රාම නිලධාරී, සංවර්ධන නිලධාරීන් සහභාගි වූහ.

දිනය අවසානයේ තිඹිරිගස්වැව විහාරස්ථානයේ දී සමාලෝචන රැස්වීමක් පවත්වා ඔවුන්ගේ ලිඛිත තොරතුරු රැස්කර ඔවුන්ගේ නිරීක්ෂණ සටහන් කර ගන්නා ලදී.

3. එල්ලංගා පද්ධතිය මගින් දැනට මුහුණ දෙන ගැටළු

3.1 භූගෝලීය විස්තර

ඉහල යාංඔය එල්ලංගා පද්ධතිය යනු CSIA ව්‍යාපෘති බල ප්‍රදේශයේ පොලොන්නරුව දිස්ත්‍රික්කයේ මොරගස්වැව ග්‍රාමනිලධාරි කොට්ඨාශයේ යාංඔය ගංගා ද්‍රෝණියේ මුහුදු මට්ටමේ සිට උස මීටර් 200 සිට 170m දක්වා භූ විශමතාවයක් පවතින ප්‍රදේශයකි. මෙම එල්ලංගාවට උතුරින් කවුඩුලුවැව හා මින්නේරිය ජාතික වන උද්‍යානය පිහිටා ඇත. මෙම ඒල්ලංගාවට මීටර 30 පමණ ගැඹුරින් මොරගහකන්ද ජලාශයෙන් ආරම්භව උතුරට ජලය ගෙනයන උතුරු ඇල ඉදිවෙමින් පවතී.

මෙම එල්ලංගා පද්ධති මධ්‍යයෙන් හබරණ - පොලොන්නරුව ප්‍රධාන මාර්ගය දිවෙන අතර එල්ලංගාවේ වයඹ දිසා මායිමෙන් හබරණ - ත්‍රිකුණාමළය ප්‍රධාන මාර්ගය දිවෙන ජනාකීර්ණ වටපිටාවක පිහිටා ඇත. එමෙන්ම නැගෙනහිර මායිම සීගිරිය අභය භූමියට මායිම්ව ඇත.

මෙහි ප්‍රධාන ප්‍රශ්නය වන්නේ වනසතුන්ගෙන් ජීවනෝපායට එල්ල වන ප්‍රහාරය හා වනජීවී සීමාවන්තුල වගාබිම් පිහිටීම නිසා ගොවිපල සංවර්ධනයේදී නීතිමය භාධාවන් පැවතීම.

3.2 භූ විද්‍යාත්මක විස්තර

මෙම එල්ලංගාව රතු දුඹුරු පස් තට්ටුවක් දැකිය හැකිය. වගාබිම් වලින් වැඩි කොටසක් වී වගාව සඳහා වෙන්ව ඇත. මෙම භූමියෙන් 60% පමන වපසරියක් මින්නේරිය ජාතික උද්‍යානය මගින් ආවරණය වන අතර බොහොමයක් වගාබිම් අනවසර වගාකරුවන් ලෙස කෘෂිකාර්මික කටයුතු වල නිරත වේ.

මෙම එල්ලංගාව වැව් 6 ක් පෝෂණය කරන අතර ඉන් වැව් 5 ක් CSIA ව්‍යාපෘතිය මගින් පුනරුත්ථාපනය වේ.

වැව් යටතේ වී ගොවිතැන පමනක් සිදුකරන අතර සියලුම වැව් යටතේ යල කන්නය වගාකාරීමට ප්‍රමාණවත් ජලය නොමැත. යල කන්නයේදී වගාලිං යටතේ පමනක් කෘෂිකාර්මික කටයුතු සිදු කරන අතර වගාලිං සංවර්ධනය සඳහා යන්ත්‍ර භාවිතයට අවසරය වනජීවී දෙපාර්තමේන්තුවෙන් නොලැබේ.

ඉඩම් පරිහරණ රටාව

Land use Pattern	Ha
Paddy Lands - Dehiaththawala & Unagollewa	13
Paddy Lands - Moragaswewa	13.7
Paddy Lands - Kadahathawewa	17
Paddy Lands - Thimbirigaswewa	8.5
Forest	200

Land use Pattern	Ha
Tank bed - Dehiaththawala	7.35
Tank bed - Unagollewa	7.38
Tank bed - Moragaswewa	14.2
Tank bed - Kadahathawewa	12.4
Tank bed - Thimbirigaswewa	5.22
Residence or High Land	298.75



3.3 ජලවිද්‍යාත්මක තොරතුරු Hydrological Details

මෙම එල්ලංගාවේ සියලුම ජල මූලාශ්‍රයන් සීගිරිය හා මින්නේරිය ජාතික වන උද්‍යානයන්ගේන් ආරම්භව **යාංඔයට එකතු වන කිමී 2 පමණ පළල් වූ පටු තීරුවක පැවතීම නිසා යල කන්නයට ප්‍රමාණවත් ජල ප්‍රමාණයක් එක්කාසු නොවීම ගැටලුවකි.**

තිඹිරිගස්වැව වාන් වතුර කුඹුරු ඉඩම් හරහා ගලායාම මාස් කන්නයේ වගාවන් හානි වීමට හේතු වී ඇත.

<u>**ස්වභාවික ජල මාර්ගයන් වෙනස් කර ඇත**</u>

මෙම එල්ලංගාව යාංඔයට ගලාබසින ස්වාධීන ස්වභාවික ජලධාරාවන් දෙකක් මූලාශ්‍ර කරගෙන පිහිටා ඇත. ඒ අනුව දෙහිඅත්තාවල හා උණගොල්ලෑව එක් ජල ධාරාවකත් මොරගස්වැව හා කඩහතවැව වෙනත් ජල ධාරාවකත් එහිම අතු ධාරාවක තිඹිරිගස්වැවත් පිහිටා ඇත. තිඹිරිගස්වැව වාන් ජලය කඩහත වැවට පහලින් ගලාගොස් යාංඔයට එකතු වේ.

නමුත් පසුකාලීනව තිඹිරිගස්වැව හැර අනෙක් වැව් 4 රූප සටහනේ දැක්වෙන ලෙස (රතුපාට කඩඉර) කෙටි ඇල මාර්ගයක් හරහා එක් පද්ධතියක් ලෙස වඩා ඵලදායිව භාවිතයට ගෙන ඇත. දෙහිඅත්තාවල හා උණගොල්ලෑව වාන් ජල මට්ටම මොරගස්වැවට ඉහලින් තිබීමේ වාසිය හේතුවෙන් කෘතිමව සකස් කල කෙටි වාන් ඇලක් මගින් මෙම වැව් 4 එක් පද්ධතියක් ලෙස ඒකාබද්ධ කර ඇත.

ඉහල යාංඔය එල්ලංගා සිතියම



CLIMATE GRAPH // WEATHER BY MONTH HABARANA



3.4 පුරාණ එල්ලංගා පද්ධතියේ වර්ගමාන තත්වය Current status of the traditional tank cascade system.

මෙම එල්ලංගාවේ දෙහිඅත්තාවල හා උනගොල්ලෑව වනජීවී රක්ෂිත වලට මායිම්ව පිහිටීම නිසා ආරක්ෂා වුවත් අනෙකුත් වැව් සංචාරක කලාපයකට මැදිව තිබීම නිසා වැව් රක්ෂිත හා වැව් තාවුලු අනවසරෙන් අත්පත් කර ගැනීම සිදුව ඇත. කඩහත වැවේ තාවුල්ලේ සංචාරක හෝටල් කීපයක්ම ඉදිව ඇති අතර මොරගස්වැව රක්ෂිතයේ කොටසක්ම සංචාරක හෝටල් කරුවකු විසින් ආක්‍රමණය කර ඇත.

සෑම වැවකම කට්ටකඩුව නැවත ප්‍රතිශ්ඨාපනය කල යුතුව ඇත. ඉහත 3.3 පරිච්චේදයේ විස්තර කර ඇති පරිදි පුරාණ එල්ලංගාව මිනිස් අවශ්‍යාවන් අනුව ජලය ගලායන දිශාවන් හරවා ඇත.

3.5 වන සම්පත් භාවිතය නිසා පාරිසරික ගැටළු වල ප්‍රබලත්වය හා ජන ජීවිතයේ පැවැත්මට එහි ඇති බලපෑම Extent of environmental issues & Related to human livelihood activities (due to usage of forest resources**)..**

මෙම එල්ලංගාව ගිණිකොණ දිගින් විශ්ව නිර්මාණයක් වන සීගිරියත්, උතුරින් මින්නේරිය ජලාශයත්, මින්නේරිය හා කවුඩුලුවැව ජාතික උද්‍යානයන්ගෙන් වටවූ ජෛව විද්‍යාත්මක වටිනාකමක් ඇති පාරිසරික පද්ධතියකට කේන්ද්‍රගතව පවතී.

3.6 සමාජ ආර්ථික ගැටළු Socio-economic issues.

මෙම එල්ලංගාව ගොවීන්ගේ කෘෂිකාර්මික ජීවන රටාව වී වගාව මුල් කරගෙන හැඩගැසී ඇත. ඓතිහාසික සීගිරිය හා වන අලි සම්බන්ධයෙන් සුප්‍රසිද්ධ කවුඩුල්ල ජාතික වන උද්‍යානය ආසන්නයේ මෙම එල්ලංගාව පිහිටීම නිසා විදේශීය සංචාරකයින් කේන්ද්‍ර කරගනිමින් ගොඩනැගුනු අතිරේක ආර්ථික ක්‍රියාවලියක් මෙහි ජීවත්වන ගොවීන්ට වාසි ගෙන දී ඇත.

බොහොමයක් දෙනාගේ ජන ජීවිතය සංචාරක කර්මාන්තය සමග බද්ධ වී ඇත.

මෙම සංචාරක සාධකය මෙහි ගොවීන්ගේ ජීවන රටාව යහපත් දිසානතියකට හැරවීමට අවස්ථාවක් වූවත් තිඹිරිගස්වැව විහාරස්ථානයේ නායක ස්වාමීන් වහන්සේ සංචාරක කර්මාන්තය පිළිබඳව අයහපත් ආකල්පය සිටීම ගමතුල සංවාදයට භාජනය වී ඇත. මෙම එල්ලංගාව කළමනාකරනයේදී සමාජ හා ආර්ථික ප්‍රෙවේෂය සංචාරක කර්මාන්තය හා බද්ධව ගොඩනැගීම කළ යුතුව ඇත. නිරායාසයෙන් විදේශිකයන්ගේ සංචාරක ගමනාන්තයක් වන මෙම එල්ලංගා ප්‍රෙද්ශය සංවර්ධනය කර ගැනීම අතිරේක ආදායම් උත්පාදනය දක්වා පරිවර්තනය කල හැකි නම් ඔවුන් එල්ලංගාව ආරක්ෂාකර පවත්වාගෙන යාමේ පුරෝගාමීන් වනු ඇත.

දිනකට සෆාරි වාහන 30-40 ක් පමණ වන රක්ෂිතයට ඇතුල් වන එක් ප්‍රෙවිශ මාර්ගයක් තිඹිරිගස්වැව වැව් බැම්ම මතින් වැටී තිබුනත් එම වැව් බැම්ම පළල් කිරීම CSIA ව්‍යාපෘතිය මගින් සිදු නොවීම පිළිබඳව ගොවීන්ගේ කනස්සල්ල එල්ල වී ඇත.

3.7 එල්ලංගා පද්ධතිය තුළ දැනටමත් සිදුවන ඉදිකිරීම් කටයුතු

එල්ලංගා පද්ධතිය තුළ ප්‍රතිසංස්කරණය කටයුතු වැව් 5 ක සිදුවේ. 2022 වර්ශයේදී මෙම එල්ලංගාවේ වැව් ප්‍රතිසංස්කණය සඳහා ඇස්තමේන්තු සකස් කිරීම හදිසියේ සිදුවීම නිසා වැව් වල පුනරුත්ථාපනය සඳහා අත්‍යවශ්‍යයන්ම ඇතුලත් විය යුතු අංග මගහැරී තිබීම බරපතල ගැටලුවකි.

3.8 එල්ලංගාවේ කුඹුරු හා ගොඩ ඉඩම් වල වගා රටාව

එල්ලංගා ප්‍රදේශයේ වැව් යටතේ ප්‍රධාන භෝගය වන්නේ වී වගාවයි. සෆාරි වාහන කුලියට දීම හෝ රියදුරන් ලෙස රැකියාවේ යෙදීමත් තම නිවාස වල Home Stay ක්‍රමයට සංචාරකයින්ට නවාතැන් සැපයීම මෙහි බොහෝ දෙනෙකුගේ අතිරේක ආදායම් වීම කෘෂිකර්මාන්තයේදී වී වගාවට ඔවුන් සීමා වීමට ප්‍රබලව බලපා ඇත.

3.9 පරිසර විද්‍යාත්මක තොරතුරු

ඉහල යාංඔය එල්ලංගා පද්ධතිය පිහිටා ඇති භූමි ප්‍රදේශය හබරණ - පොලොන්නරුව හා හබරණ - ත්‍රිකුණාමලය ප්‍රධාන මාර්ගයන්ට යාබදව පිහිටා තිබීම නාගරික පරිසරයක වට පිටාවක් පැවතීමට හේතු වී ඇත. සංචාරක හෝටල් කීපයක්ම වැව් ආශ්‍රිතව තිබීම හා ඉඩම් වල වානිජ වටිනාකම ඉහල වීම වැව් රක්ෂිත පවත්වාගෙන යාමට තර්ජනයක් වී ඇත.

මෙම එල්ලංගාව උතුරින් සහා නැගෙනහිරින් වන රක්ෂිත වලට මායිම්ව ඇත. ඉහල යාංඔය එල්ලංගා පද්ධතිය ආශ්‍රිතව අනෙකුත් ඉඩම් පරිහරණ රටාවන් ලෙස ලඳු කැලෑ, උස් බිම් වගා ඉඩම්, වැව්, කුඹුරු යායවල්, නිවාස සහ ගෙවතු වගාවන් දැක්විය හැකිය. මෙම එක් එක් ඉඩම් පරිහරණ රටාවන් ආශ්‍රිතව සුවිශේෂී පරිසර පද්ධති ක්‍රියාත්මක වන අතර ඒවායේ යහ පැවැත්ම එල්ලංගා පද්ධතියේ තිරසාරත්වය කෙරෙහි සෘජුවම බලපානු ලබයි. වන රක්ෂිත නොවන සියලුම උස්බිම් නේවාසික හෝ වානිජ කටයුතු සඳහා යොදාගෙන ඇත. වනාන්තර, වැව් පද්ධතිය, වන සතුන්, පුරා විද්‍යාත්මක ස්ථාන හා සුවිශේෂී භූ විෂමතාවය නිසා මෙම එල්ලංගා පද්ධති ප්‍රදේශය තුල සංචාරක ව්‍යාපාරය ප්‍රමුඛව සිදු වේ. සංචාරක හෝටල් හා වෙනත් සේවාවන් සපයන ආයතන බහුලව දැකිය හැකිය. ඉහල යාංඔය එල්ලංගා පද්ධතියේ ප්‍රතිලාභීන් ඉහත සඳහන් පරිසර පද්ධතින් සමඟ සහජීවී මෙන්ම තරඟකාරී ගතිලක්ෂණයන් පෙන්වමින් කටයුතු කරණු ලබන බව හරස්කඩ චාරිකාවේ දී නිරීක්ෂණය විය.

මෙම වනාන්තර වියළි කලාපීය මිශ්‍ර සදාහරිත වනාන්තර කාණ්ඩයට අයත්වන අතර ඒවායේ සුලබව දැකිය හැකි පලු, වීර, බුරුත, වෙලං, මොර, කලුවර, මයිල, මිල්ල, දඹ වැනි ශාක ඝන වනාන්තරවල ප්‍රමුඛ වන අතර සේර, එරමිනියා, කටුපිල, දෙමට, කැලිය, දිවුල් වැනි ශාක ලඳු කැලෑවල ද කුඹුක්, නඹඩ, තිඹිරි, කරඳ, මී වැනි ශාක සමහර වැව් ආශ්‍රිතව ද කොස්, පොල්, කජු, පේර, දෙළුම්, අඹ, දිවුල්, බෙලි ආදී ශාක ගෘහාශ්‍රිත ගෙවතු වගා පද්ධතීන්හි ප්‍රමුඛ ශාක වේ.

එල්ලංගා පද්ධතිය තුළ දැකිය හැකි ප්‍රධාන සත්ත්ව විශේෂ ලෙස වන අලි, ඌරන්, ඉත්තෑවන්, මීමින්නන්, ගෝනුන්, රිලවුන් හා වඳුරන් වැනි සිවුපාවුන්ද, තලගෝයා, කබරගොයා, සර්පයින් වැනි උරගයන්ද වලි කුකුළන්, මයිනන්, කොක්කු, මොනරුන් කොබෙයියන්, කොණ්ඩ කුරුල්ලන් ආදි පක්ෂි විශේෂ ද ඉබ්බන්, කිඹුලන්, කබරගොයා, ගෙම්බන්, මත්ස්‍ය විශේෂ ආදි ජලජ ජීවීන් ද සුලබව දැකිය හැකිය. එල්ලංගා පද්ධති ප්‍රදේශය තුල සත්ව විශේෂයන් ගේ සමතුලිතතාවය යම් පමණකට බිඳ වැටී ඇති අතර වන අලින්, මොනරුන්, රිලවුන්, දඬු ලේනුන් හා වඳුරන් වැනි සතුන්ගේ ගහනයන් ගේ ඉහළ යාමක් පෙන්නුම් කරයි. එබැවින් අලි මිනිස් ගැටුම හා වන සතුන්ගෙන් සිදු වන වගා හානිව ඉහළ යාමක් පෙන්නුම් කරයි.

මෙම එල්ලංගා පද්ධති ප්‍රදේශය තුළ ජීවත් වන ප්‍රජාව පාරිසරික සේවාවන් රාශියක් වනාන්තර පරිසර පද්ධතියෙන් ලබා ගන්නා අතර (පළතුරු හා වෙනත් ආහාරමය ද්‍රව්‍යයන්, එදිනෙදා භාවිතයට අවශ්‍ය කුඩා ලී දඬු ලබා ගැනීම හා ගවයන් සඳහා ආහාර සපයා ගැනීම) පරිසර පද්ධතියට ප්‍රජාවෙන් සිදුවන බලපෑම වැඩිවෙමින් පවතින අතර එය වනාන්තර පරිසර පද්ධතියට හා වන සතුන්ට අහිතකර ලෙස බලපායි.

වර්තමානයේ දී විවිධ වූ මානව ක්‍රියාකාරකම් හේතුවෙන් එල්ලංගාව තුළ පිහිටි පරිසර පද්ධතීන්න්ගේ යහපැවැත්මට බලපෑම් එල්ලවෙමින් පවතී. මේ නිසා එල්ලංගාවේ තිරසාර පැවැත්මට පාරිසරික සේවාවන් දුර්වල වීමට, ජීවනෝපායන් අවහිර වීම වැනි පාරිසරික, සමාජීය හා ආර්ථික විපර්යාසයන්ට භාජනය වෙමින් පවතී.

වන අලින් රිළවුන්, මොනරුන් වැනි සතුන් එල්ලංගා පද්ධතිය පුරාම සංචරණය කරන අතර බෝග වගා විනාශ කිරීම, නිවෙස්වලට අලාභ හානි කිරීම, මිනිසුන්ට අලි පහරදීම් නිතර වාර්තා වන අතර වන අලි පහරදීම් නිසා ජීවිත හානි වීම් ද වාර්තා වෙයි. වන අලි මෙම එල්ලංගාවේ වැව් බැම් හරහා හා ඇළ වේලි පද්ධතීන් හරහා ගමන් කිරීම නිසා ඒවාට හානි වීම සිදු වෙයි. එමෙන්ම මිනිසුන්ගේ ක්‍රියාකාරකම් නිසා වන අලින්ට සිදුවන හිරිහැරද වැඩි වී ඇත. එනම් විවිධ පුපුරණ ද්‍රව්‍ය ආහාර තුළට ඇතුළ් කිරීම, වෙඩි තැබීම, ආහාර සමඟ වස මිශ්‍ර කිරීම හා තුවක්කු බැඳීම ආදි ක්‍රියා නිසා තුවාල ලබන හා මිය යන අලි ප්‍රමාණය ද ක්‍රමිකව ඉහළ ගොස් ඇති බව වන ජීවී නිළධාරීන් සමඟ සිදු කල සාකච්චාවන් හි දී හඳුනාගන්නා ලදි.

වැව් රක්ෂිත වල අනවසරයෙන් වගා කිරීම් හා ගොඩනැඟිලි ඉදිකර ඇති අවස්ථා කීපයක් ම එල්ලංගා පද්ධති හරස්කඩ චාරිකාවේ දී නිරීක්ෂණය විය. (මොරගස්වැව, කඩහත වැව හා තිඹිරිවැව) මෙසේ වැව් රක්ෂිත වල ගොඩනැගිලි ඉදිකර සංචාරක කර්මාන්තය සඳහා යොදාගෙන ඇත. ඒවායේ අපද්‍රව්‍ය ක්‍රමවත්ව බැහැර කිරීමක් සිදු නොකරන බැවින් වැව් ජලයට මුසු වී ජලදූෂණය සිදු වේ. හරස්කඩ චාරිකාවට එක් වූ ගොවීන්ගේ ප්‍රධාන ඉල්ලීමක් වූයේ වැව් රක්ෂිත වෙන් කර අනවසර ඉදිකිරීම් ඉවත් කර දෙන ලෙසයි. මෙම එල්ලංගා පද්දතියේ වැව් වල වැව් පරිසර පද්ධතිය (Tank Eco System) සැලකීමේ දී සාපේක්ෂව හොඳ මට්ටමක පවතින අතර එයට ප්‍රධාන හේතුව වී ඇත්තේ මෙම වැව්

බොහොමයක් වන රක්ෂිත ප්‍රදේශ තුල පිහිටා තිබීමයි. නමුත් කඩහතවැව හා තිඹිරිවැවෙහි වැව් පරිසර පද්ධතිය දුර්වල තත්වයක පවතී. වැව් පරිසර පද්ධතිය හොඳින් පැවතීම, වැවේ හා පෝෂක ප්‍රදේශයේ ඵලදායිතාව හා තිරසාරත්වය කෙරෙහි සෘජුවම බලපායි. ගස්ගොම්මන, කට්ටකාඩුව, පෙරහන, ඉස්වැටිය, තිස්බඹේ, කිවුල් ඇළ ආදි පුරාණ වැවක පැවති කොටස් වලින් වැවේ හරස් ජල කාන්දුව අවම කිරීම, වාෂ්පීකරනය අවම කිරීම, පාංශු ඛාදනය අවම වීම, බැර ලෝහ රඳවා ගැනීම, ලවනීකරණය වැළැක්වීම වැනි පරිසර හිතකාමී කාරයයන් රැසක් ඉටු කරනු ලැබීය.

අනු අංකය	උග්‍ර ගැටලුව	විෂය ක්ෂේත්‍රය
01	කාබනික ද්‍රව්‍ය හා රසායනික පෝෂක වැව් ජලය හා මිශ්‍ර වීමෙන් වැව තුළ සුපෝෂණ තත්ත්ව ඇති වීමෙන් ආක්‍රමණශීලී ජලජ ශාක (සැල්වීනියා, ජපන් ජබර) හා අනෙකුත් ජලජ ශාක ශීඝ්‍ර වර්ධනය හා ව්‍යාප්තිය නිසා වැව්වල නඩත්තු සහ මෙහෙයුම් කටයුතුවලට බාධා වීම.	කෘෂි නිෂ්පාදන
02	වැව් රක්ෂිත සීමා සලකුනු කර නොමැති නිසා අනවසර ගොඩනැගිලි හා වගාවන් සඳහා අනවසරයෙන් අත්පත් කර ගැනීම (කඩහතවැව, මොරගස්වැව හා තිඹිරිවැව)	
03	වැව් පරිසර පද්ධතියේ සංරචක වන කට්ටකාඩුව, ගස්ගොම්මන, පෙරහන කිවුල් ඇළ වැනි ව්‍යූහයන්ට හානිකර ඇති නිසා ජලය වාෂ්පීකරණය ඉහළ යාම, පෝෂක ප්‍රදේශය ලවණතාවයට භාජනය වීම, රොන්මඩ තැන්පත් වීම ඉහළ යාම වැනි අහිතකර තත්ත්වයන් වර්ධනය වීම.	වාරිමාර්ග
04	නිදැල්ලේ හැසිරෙන ගව රංචු වන රක්ෂිතවලට ඇතුළ් වී තණකොළ උලාකෑම, වන සංරක්ෂණ ප්‍රදේශවල ප්‍රමාණවත් ආහාර නොතිබීමත්, වන අලි ගහනය ඉහළ යාමත් නිසා වන අලි ගම්මානවලට සංචරණය වීම ඉහළ යාම නිසා වගා හානි, දේපළ හානි සහ වැව් බැම් හා ඇළ වේලි පද්ධතීන්ට හානි සිදු කිරීම.	වන ජීවි
05	එල්ලංගා ප්‍රදේශය තුළ ඇති වගා ළිංවලින් ජලය ලබාගෙන දීර්ග කාලයක් වගා කටයුතු සිදු කරන ඉඩම් හා කිවුල් ඇළ නිසියාකාරව නොමැති නිසා කුඹුරු ඉඩම් ක්‍රමිකව ලවනීකරණයට පාත්‍ර වීම.	කෘෂිකර්ම නිෂ්පාදන
06	වන සතුන් ඉලක්ක කර තුවක්කු බැඳීම /කදන් බැඳීම හා වෙඩි තැබීම මඟින් සතුන් දඩයම් කිරීමට පිරිසක් පෙළඹී සිටීම.	වන ජීවි

3.10 ජල පෝෂක ප්‍රදේශ වල පවතින ගැටළු Issues in the command area.

සමස්තයක් ලෙස ගත්කල මෙම එල්ලංගාවේ වාරි පද්ධතීන් සියල්ලම පුනරුත්ථාපනය කලයුතු තත්වයේ පවතී. **CSIA** ව්‍යාපෘතිය යටතේ වාරි පද්ධතිය පුනරුත්ථාපනය සිදු නොවේ. මුලුමනින්ම වර්ෂා පෝෂක වැව් මෙම එල්ලංගාවේ ඉහල කොටසේ පැවතීම නිසා ප්‍රමාණවත් ජලයක් නොලැබේ.

මෙම එල්ලංගාව දෙහිඅත්තාවල හා උණගොල්ලෑව වනජීවි කලාපය තුලම පිහිටීම නිසා නිතර වන අලි ගැවසෙන අතර වැව් බැම්ම හා ඇලවේලි පද්ධතිය සංරක්ෂණය කර පවත්වාගෙන යාමේ දුෂ්කරතාවයන් පවතී.

4. එල්ලංගා පද්ධති කළමනාකරණය

පොලොන්නරුව දිස්ත්‍රික්කයේ ඉහල යාංඔය නමින් යාංඔය ගංගා ද්‍රෝණියේ එල්ලංගා පද්ධති කළමනාකරණ කමිටුවක් සහා කිරිඔය හා ඊරිගේඔය එක් එල්ලංගාවක් ලෙස මින්නේරිය ඔය ගංගා ද්‍රෝණියේ වශයෙන් එල්ලංගා පද්ධති කළමනාකරණ කමිටු දෙකක් ස්ථාපිත කිරීම සිදුවේ.

ඒ අනුව කිරිඔය හා ඉහල යාංඔය එල්ලංගා පද්ධති කළමනාකරණ කමිටු දෙක පොලොන්නරුව දිස්ත්‍රික්කයේ නියමු ව්‍යාපෘතියක් ලෙස ක්‍රියාත්මක කෙරේ.

4.1 එල්ලංගා කළමනාකරණ කමිටුවක අවශ්‍යතාවය

එල්ලංගාවක්, ජල පෝෂක ප්‍රදේශයේ මතුපිට මෙන්ම භූගත ජල මට්ටම සුරක්ෂිත කරන අතර එහි ප්‍රතිපලයක් ලෙස ජනතාවට බීමට,රෙදි සේදීමට,ආහාර පිසීමට සහ වගා කටයුතු වලට ජලය සපයනු ලබයි. රූප සටහන් අංක 1 අනුව රාජ්‍ය,පෞද්ගලික සහ ප්‍රතිලාභී පාර්ශවකාර ආයතන එල්ලංගාව ආරක්ෂා කරනු ලබයි. එසේ වූවද අංක 3 කොටසේ සඳහන් පරිදි නියමිත ලෙස පාර්ශවකරුවන්ගේ අවධානය යොමු නොවීම සහ ස්වාභාවික සහ මානව ක්‍රියාකාරකම් හේතුවෙන් එල්ලංගාව දැඩි ලෙස පරිහානියට පත්ව ඇත.එල්ලංගාව ආරක්ෂාව කිරීම සඳහා පාර්ශවකරුවන් සම්බන්ධ වීමට වඩාත් යෝග්‍ය ආයතන ව්‍යුහයක් නොමැති වීම නිසා එල්ලංගාව තව දුරටත් හානියට ලක් විමේ ප්‍රවනතාවක් පවතී.එම නිසා එල්ලංගා කළමනාකරණ කමිටුව වැනි සම්බන්ධීකරණ ආයතනයක් එල්ලංගාව ආරක්ෂා කිරීම සඳහා ක්‍රියාමාර්ග ගැනීමට වඩාත් අවශ්‍ය වී ඇත.

4.2 එල්ලංගා පද්ධති කළමනාකරණ කමිටු පිහිටුවීම

එල්ලංගා පද්ධතියක් යනු අතීතයේ සිට වැව් කලමණාකරනයේදී භාවිතා කරන ලද සාම්ප්‍රදායික ජල කලමණාකරන ක්‍රමවේදයකි.එල්ලංගාව යන වචනය සිංහල භාෂාවේ වචන දෙකක් එකතු වී සකස් වී ඇත.එනම්,"**එල්ලන්**" සහ "**ගාව**" යන්නයි.එල්ලන් යනු එල්ලෙන යන්නයි.ගාව යනු එකකට පසු අනෙක් ඒවා යන්නයි.එල්ලංගාව යන වචනයේ අදහස වනුයේ ඉහල සිට පහලට එකිනෙකට සම්බන්ධිත ලඟින් පිහිටි වැව් පද්ධතියක් යන්නයි.ශ්‍රී ලංකාවේ මෙම වාරි තාක්ෂණ එක්සත් ජාතීන්ගේ ආහාර සහ කෘෂිකර්ම සංවිධානය (FAO) විසින් ලෝක උරුමයක් ලෙස නම් කර ඇත.එල්ලංගා කලමණාකරන කමිටු පිහිටුවීමේ අදහස වනුයේ දශක කිහිපයකට පෙර පැවති ලෙස එල්ලංගාව පවත්වාගෙන යාම සහ එල්ලංගා කලමණාකරන කමිටු පිහිටුවීමට,නීතිගත කිරීමට සම්බන්ධිත සියලුම පාර්ශවකරුවන් පොදු සංසදයක් ලෙස වැඩ කර එල්ලංගාව ආරක්ෂා කිරීමට කටයුතු කිරීමයි. පරිපාලන දිස්ත්‍රික්ක 11ක අදාල ප්‍රාදේශීය කෘෂිකර්ම කමිටු වල සහාය ඇතිව ගොවිජන සංවර්ධන දෙපාර්තමේන්තුව විසින් නිකුත් කරන ලද අංක 06/2023 දරන චක්‍ර ලේඛය අනුව (ඇමුණුම 01) එල්ලංගා කලමණාකරන කමිටු 53ක්

පිහිටුවීමට ගොවිජන සංවර්ධන දෙපාර්තමේන්තුව බලාපොරොත්තු වේ.ලෝක බැංකු මූල්‍ය ආධාර මත කෘෂිකර්ම අමාත්‍යාංශය මගින් ක්‍රියාත්මක දේශගුණ සුහුරු වාරි කෘෂිකර්ම ව්‍යාපෘතිය ගොවිජන සංවර්ධන දෙපාර්තමේන්තුව සහ අදාල පාර්ශවකරුවන් සමඟ සමීපව කටයුතු කර එල්ලංගා කලමණාකරන කමිටු 53 පිහිටුවීමේ සමස්ථ ක්‍රියාවලිය සඳහා සහාය ලබාදේ.

එල්ලංගා කලමණාකරන කමිටු සාමාජිකත්වය පහත ආයතන නියෝජිතයින්ගෙන් සමන්විත වේ.ඒවා නම් ගොවිජන සංවර්ධන දෙපාර්තමේන්තුව,පළාත් වාරිමාර්ග දෙපාර්තමේන්තුව, පළාත් සහ අන්තර් පළාත් කෘෂිකර්ම දෙපාර්තමේන්තුව, වන සංරක්ෂණ දෙපාර්තමේන්තුව, වනජීවී සංරක්ෂණ දෙපාර්තමේන්තුව, ප්‍රාදේශීය ලේකම්වරු, ගොවි සංවිධාන, ප්‍රජා මූලික සංවිධාන, ජල සම්පත් මණ්ඩලය, ආපදා කලමණාකරන කාර්යාංශය, පොලිස් දෙපාර්තමේන්තුව, ජාතික ජලජ ජීවී සංවර්ධන අධිකාරිය, පරිසර අධිකාරිය, පෞද්ගලික අංශය, ඉඩම් පරිහරණ සැලසුම් දෙපාර්තමේන්තුව යන ආයතන වේ. එල්ලංගා කලමණාකරන කමිටුවක මූලික වගකීම වනුයේ එල්ලංගාව ආරක්ෂා කිරීම සහ පවත්වාගෙන යාම සඳහා සුදුසු ක්‍රියාමාර්ග ගැනීම සහ උපාය මාර්ගික මැදිහත්වීම් ක්‍රියාත්මක කිරීමයි.රාජ්‍ය ආයතන,පෞද්ගලික අංශය,ප්‍රජා මූල සංවිධාන ඇතුලු පාර්ශවකරුවන් රාශියකට එල්ලංගාව ආරක්ෂා කිරීමේ හා කළමනාකරණ කිරීමේ වගකීම පැවරී ඇත.ප්‍රධාන පාර්ශවකරුවන් පහත රූප සටහනේ දක්වා ඇත.

Institutional Frame Work of Upper Yanoya Cascade Management



4.3 එල්ලංගාව කළමනාකරණ සැලැස්ම සකස් කිරීමේ අනුගමනය කරන ලද ක්‍රමවේදය

එල්ලංගාව කළමනාකරණය සඳහා සැලැස්ම සකස් කිරීම සඳහා කරුණු කිහිපයක් කෙරෙහි අවධානය යොමු කල යුතු විය.

- ගැටළු හඳුනාගැනීම හා තත්ව විශ්ලේෂණය - Diagnosis
- අරමුන - Objective
- ක්‍රමවේදය - Mechanism
- ඇගයීම - Evaluation

මෙම කළමනාකරණ සැලැස්ම ගොඩ නැගීම DOME ක්‍රමවේදයට අනුව පෙළගස්වන ලදී.

ගැටළු හඳුනාගැනීම හා තත්ව විශ්ලේෂණය (Diagnosis)

මේ සඳහා ක්‍රමවේදයන් කිහිපයක් අනුගමනය කරන ලද ප්‍රාදේශීය ලේකම් කාර්යාල, ගොවිජන සේවා මධ්‍යස්ථාන, වාරිමාර්ග කාර්යාල යනාදිය විසින් නඩත්තු කරන ලද දත්ත, CSIAP ව්‍යාපෘතිය විසින් සකස් කරන ලද ජලවිධ්‍යාත්මක සමීක්ෂණ (hydrological survey), ඉංජිනේරු සමීක්ෂණ (Engineering survey) සහ අවධානිත ප්‍රදේශ කෘෂිකර්ම සංවර්ධන සැලැස්ම (HSAADP) යනාදිය තොරතුරු විශ්ලේෂණය කරන ලදී. අනුව පහත පරිදි සකස් කරනු ලැබූ දත්ත ගොනු කරන ලදී.

- සාමාජීය දත්ත
- භූ විද්‍යාත්මක දත්ත
- පරිසර විද්‍යාත්මක දත්ත
- ජල විද්‍යාත්මක දත්ත
- සිතියම් විද්‍යාත්මක දත්ත

රැස් කල අතර හරස්කඩ සංචාරය මඟින් මෙම දත්ත වල නිරවද්‍යතාවය තහවුරු කරගත් අතර ප්‍රයෝගිකව පවතින ගැටළු, පාරිසරික සම්පත්, සමාජීය ගැටළු, වැව් පද්ධතියේ පවතින තත්වයන්, සංස්කෘතිමය පුරුදු, අනවසර ඉදි කිරීම් හා රක්ෂිත අත්පත් කරගැනීම්, පුරා විද්‍යාත්මක සාධක හා එවැනි ස්ථාන ගවේෂණය, ධීවර කර්මාන්තය සඳහා ඇති ඉඩ කඩ, පරිසරයේ සිටින වන සතුන්, සර්පයින්, උරඟ විශේෂයන්, එම සතුන්ට ඇති වී ඇති තර්ජනයන්, වන විනාශයන්, ඓතිහාසික වැවේ ශේෂව ඇති අංග හා එහි අංග නැවත ස්ථාපනය සඳහා පවතින ඉඩකඩ හා අභියෝගයන් යනාදී සියලු තොරතුරු විද්‍යාත්මකව ප්‍රතිලාභී ප්‍රවේශය හරහා එක්කාසු කර ගන්නා ලදී. ඊට අමතරව රාජ්‍ය නිලධාරීන්, ගොවීන් සමඟ රැස්වීම් පැවැත්වීම මඟින්ද දත්ත එක්කාසු කිරීම කරන ලදී,

මේ අනුව හරස්කඩ සංචාරය හා ද්විතික තොරතුරු ආශ්‍රයෙන් කිරිඔය එල්ලංගාවේ පවතින තත්වය විස්තර කිරීම සඳහා එල්ලංගාවේ පැතිකඩ නිර්මාණය අවශ්‍යතම පියවරක් විය.

එල්ලංගා පද්ධති කළමනාකරණ සැලැස්ම සකස් කිරීමේ අරමුණු

වසර 2000 කට වඩා පැරණි ලාංකීය ශිෂ්ඨාචාරයේ සංස්කෘතික මැවුමක් ලෙස එල්ලංගා පද්ධතිය විස්තර කර ඇත. ලෝකයේ බොහොමයක් ශිෂ්ඨාචාර ගංගා ආශ්‍රිතව ගොඩ නැගෙද්දී ලාංකීය ඓතිහාසික යුගයක් රටේ භූ විෂමතාවය අධ්‍යනය කර රට මැද පැවති කඳු පන්තියත් හා පරිසර පද්ධතියත් ආරක්ෂා කරගනිමින් වියලි කලාපයේ කෘෂිකාර්මික කටයුතු සඳහා මුහුදට ගලා යන ජල ධාරාවක් භාවිතා කරමින් සශ්‍රීක රාජ්‍යක් බිහි කර තිබුණි. රට මධ්‍යයේ සිට ගලා යන ගංගා පද්ධතිය වියලි කලාපය පෝෂණය කිරීමටත් වසරේ එක් කාලයක පමණක් ලැබෙන වර්ෂාපතනය කළමනාකරණය කර වර්ෂය පුරා එම ජලය පරිහරණය කලයුතු සමාජයක් ගොඩ නගා තිබුණි. පුරාණ වැවේ සෑම අංශයක්ම විද්‍යාත්මක පසුබිමක සැලසුම් සහගතව සංවිධානය වුවකි. උදාහරණ ලෙස ජල ධාරාවක ගලා එන ජලය ගොඩ වල හරහා රොන් මඩ තැන්පත් කර පිරිසිදු ජලය වැවට එක්කාසු වීම, කැට සොරොව්වද එවැනිම විද්‍යාත්මක මෙවලමකි. වැවේ අඩියේ ජලය වැවේ තැන්පත් කර ඉහල වතුර කැට සොරොව්ව හරහා නිකුත් කෙරේ. කට්ට කඩුව, ගස් ගොම්මන යනාදී සියලු අංග මෙම පරිසර පද්ධතිය සමතුලනය කරන ලදී.

වත්මනේදී මෙම පද්ධතියේ හරයන් පිලිබඳ කිසිදු දැනුමකින් තොරව හෝ දැනුවත්ව මෙම පද්ධතිය විනාශ කිරීමට සමාජ ක්‍රියාකාරකම් ඉදිරියට ඇවිත් ඇත.

එල්ලංගා පද්ධති කළමනාකරණ දේශගුණ සුහුරු ක්‍රියාවන් වලදී ව්‍යාපෘතියේ ප්‍රධාන අංශයක් ලෙස මුල සිටම සැලසුම් වන්නේ විශේෂයෙන්ම වැව් පුනුරුත්තාපනයෙන් ඔබ්බට ගිය තිරසාර වැඩසටහනකට මුල පිරීමට ඇති අවශ්‍යතාවය හා අරමුණු නිසාවෙන්ය.

මේ අනුව පුරාණ වැව, එල්ලංගාව කෙසේ වෙතත් දැනට ශේෂව ඇති අංගයන් හෝ ආරක්ෂා කිරීමටත් හැකි අයුරින් එකී අංග නැවත ගොඩ නැගීමටත් දේශගුණික සුහුරු කෘෂිකර්මාන්තය හා එල්ලංගා පද්ධති කළමනාකරණ තුලින් ව්‍යාපෘතියේ සංවර්ධන වැඩසටහන් තිරසාර බැවින් ශක්තිමත් කිරීමේ ප්‍රධාන සාධකයක් ලෙස හඳුනාගෙන ඇත.

එය විද්‍යාත්මක ප්‍රවේශයක් මඟින් සිදු කිරීමට ලෝක බැංකු නිලධාරීන්ගේ උපදේශනය හා ව්‍යාපෘතියේ නිලධාරීන්ගේ මඟ පෙන්වීමෙන් මෙය සාක්ෂාත් කර ගැනීමට එල්ලංගා පද්ධති කළමනාකරණ සැලැස්ම සකස් කිරීමේ අරමුණ වේ.

ක්‍රමවේදය (mechanism)

හඳුනා ගත් ගැටළු හා සම්පත් කළමනාකරණය කරමින් ශක්තිමත් සංවර්ධන ව්‍යුහයක් ගොඩ නැගීම මෙම ක්‍රියාත්මක ක්‍රමවේදයේ සඳහන්ය.

ඒ සඳහා එල්ලංගා පද්ධති කළමනාකරණ කමිටුවක් ස්ථාපිත කරන අතර එහි පෙරටුගාමී සාමාජිකයෝ වන්නේ එල්ලංගාව පරිහරණය කරන රාජ්‍ය ආයතන ආරක්ෂා කිරීමට නිතීමය වගකීම් ඇති හා ඒ සඳහා උනන්දුවක් දක්වන රාජ්‍ය නිලධාරීන්, සමාජ ක්‍රියාකාරීන් හා එල්ලංගා වේ ජීවත් වෙන එහි ඍජු ප්‍රතිලාභීන්ය.

මෙම කමිටුව බලගැන්වීම සඳහා නෛතික පසුබිමක් සකස් කිරීමටත් සියලු අදාල පාර්ශවයන් අභිප්‍රේරණය කිරීමට කෘෂිකර්ම අමාත්‍යාංශ ලේකම් විසින් නිකුත් කරන ලද 2022.07.21 දිනැති ලිපියත් ගොවිජන සංවර්ධන දෙපාර්තමේන්තුවේ කොමසාරිස් ජනරාල් 2023.08.03 දිනින් නිකුත් කල 06/2023 චක්‍රලේකයත් අවශ්‍ය පසුබිම සකස් කර ඇත.

මේ අනුව ප්‍රාදේශීය ලේකම් හා ගොවි නියෝජිතයෙකු සම සභාපති ලෙසත් ගොවිජන සේවා බල ප්‍රදේශයේ ප්‍රාදේශීය නිලධාරී හා ගොවි නියෝජිතයෙකු සම ලේකම් වන අනෙක් රාජ්‍ය අංශය හා ගොවි සංවිධාන නියෝජිතයන් මෙන්ම අනෙක් ප්‍රජා සංවර්ධන නියෝජිතයන්ගෙන් සමන්විත නීත්‍යානුකුල භාවයක් සහිත කමිටුවක් ස්ථාපනය වනු ඇත.

ඉහත සංකල්පය මඟින් ලැබෙන නීතිමය භාවය මෙම සංවිධානයේ තිරසාර භාවය හා වගකීම තහවුරු කරනු ඇත.

අද දවසේ CSIAP වෙත පැවරී ඇත්තේ මෙම එල්ලංගා පද්ධති කළමනාකරණ කමිටු ස්ථාපනය කර එහි තිරසාර පැවැත්ම සඳහා අවශ්‍ය යටිතල පහසුකම් සැපයීම, සම්පත් ලබා දීම හා අවශ්‍ය මඟ පෙන්වීම් ලබා දී එල්ලංගා පද්ධතිය කළමනාකරණය සුදුසු මට්ටමට ඔසවා තිබීමය.

ඇගයීම (Evaluation)

එල්ලංගා පද්ධති කළමනාකරණ සැලැස්ම සකස් කර එය ක්‍රියාවට නැංවීමේදී අපේක්ෂිත ඉලක්ක කරා ලඟා වෙන්නේද යන්න විශ්ලේෂණය කිරීම මෙහිදී බලාපොරොත්තු වේ. ඒ සඳහා කාර්ය සාධන දර්ශක (KPI) හා සන්ධිස්ථාන සලකුණු (Milestone) සැලැස්මේ අවසාන පරිච්චේදයේ සඳහන් වේ.මෙම ඇගයීම් ක්‍රියාවලිය අඛණ්ඩව සිදු කිරීමෙන් එල්ලංගා පද්ධති කළමනාකරණය අපේක්ෂිත ඉලක්ක කරා ගෙන යා හැකි වනු ඇත.

4.4 එල්ලංගා පද්ධති කළමනාකරණ සැලැස්ම සකස් කිරීම

මේ සඳහා සහා කරුණු විශ්ලේෂණයක යෙදිය යුතුය.

- සම්පත් හඳුනා ගැනීම
- තර්ජන හඳුනා ගැනීම
- ගැටළු හඳුනා ගැනීම
- එල්ලංගා කළමනාකරණය සඳහා ඇති අවස්ථා හඳුනා ගැනීම

හරස්කඩ සංචාරය, රූස්වීම් යනාදියගෙන් ලබා ගත් තොරතුරු දත්ත මෙන්ම ද්විතික මූලාශ්‍ර වලින් ලබා ගත් දත්ත විශ්ලේෂණය කර ඉහත බාණ්ඩ හතරට ගොනු කල යුතුය.

4.5 ඉහල යාංඔය එල්ලංගාව මුහුනදෙන ප්‍රධාන අභියෝගයන්

මෙම එල්ලංගාව මුහුණ දෙන අභියෝග පහත හේතූන් ඔස්සේ වර්ගීකරණය කල හැකිය.මේ සඳහා පදනම වුයේ එල්ලංගාවේ පැතිකඩය.

4.5.1 භූගෝලිය සාධක මත පදනම් වූ අභියෝග :-

මෙම එල්ලංගාව මින්නේරිය හා කවුඩුලුවැව ජාතික උද්‍යානයට මායිම්ව වනජීවී හා වනසංරක්ෂණ කලාපයක් කේන්ද්‍රගතව පිහිටා තිබීම සාධනීය පාරිසරික පද්ධතියක් පවත්වාගෙනයාමට ඉවහල් වී ඇත. මෙම එල්ලංගාව කමිටුවක් ලෙස ක්‍රියාත්මක වීමට අභියෝගයන් භූගෝලීය සාධක මත ඇති වී ඇත.

4.5.1.1 එල්ලංගා පද්ධති තලමනාකරණ කමිටුවේ සභාපති හා ලේකම් පද්ධතියේ සිට කිමී 35 පමණ දුරින් රාජකාරී වල නියැලීම. මෙම එල්ලංගාව හිඟුරක්ගොඩ පරිපාලන කලාපයේ පිහිටා තිබුනත් එල්ලංගාව දුරින් පිහිටා තිබීම කළමනාකරණය සඳහා අපේක්ෂාකල නායකත්වය ප්‍රාදේශීය ලේකම් සහා ගොවිජන ප්‍රාදේශීය නිලධාරීගෙන් ලබාගැනීම දුෂ්කරය. මෙම භූගෝලීය සාධකය හේතුවෙන් විකල්ප ආකෘතියක් පිළිබඳව සලකා බැලිය යුතුව ඇත.

4.5.2 ජල විද්‍යාත්මක අභියෝග :-

මින්නේරිය හා කවුඩුල්ල ජලාශයන් වල ජලධාරා ප්‍රෙද්ශයට මායිම් මෙම එල්ලංගාව පිහිටා තිබීම නිසා සියලුම වැව් වල ප්‍රමානවත් ජල පෝෂක ප්‍රෙදේශයක් නොමැත. මේ නිසා කඩහත වැව සහා මොරගස්වැව පමනක් මාස් මෝසම් වැසි කාලයේදී වාන් මට්ටමට ලගා වේ. නමුත් මෙම වැව් රක්ෂිතයන් සංචාරක හෝටල් හිමියන් හා පදිංචි කරුවන් විසින් ආක්‍රමණය කර තිබීම නිසා මුලු ධාරිතාවයෙන් ජලය පවත්වාගෙන යාම අසීරු වී ඇත. මෙම තත්වය වගා තීව්‍රතාවයන් ඉහල නන්වමින් කෘෂිකාර්මික කටයුතු සංවර්ධණයට බාධාවන් වී ඇත.

4.5.5 එල්ලංගා පද්ධති කළමනාකරණ කමිටු සැලැස්මේ හඳුනා ගත් ගැටළු සහ සමාජ ආරක්ෂණ මැදිහත් වීම

එල්ලංගා පද්ධති කළමනාකරණ කමිටු සැලැස්ම සැකසීමේ මුලික පියවරක් ලෙස හරස්කඩ චාරිකාව තුලින් සිදු කල ගවේෂණය තුලින් සාමාජීය වශයෙන් මුලිකවම අපේක්ෂා කරනු ලබන්නේ, එල්ලංගා පද්ධතිය තුල සමාජීය සංවර්ධනය සඳහා මහ පෙන්වීමයි. එහිදී, සමාජීය වශයෙන් එල්ලංගා පද්ධතිය පිලිබඳ පවතින සමාජ ගැටළු, වැඩි අවධානයක් යොමු කල යුතු කරුණු, ගැටළු විසඳීමට භාවිතා කල හැකි ක්‍රමවේදයන් පිළිබඳව මෙහිදී කරුණු විමසා බැලේ.

මෙම එල්ලංගාවේ ගොවි සංවිධාන තුනක් ස්ථාපිත වී ඇති අතර කඩහත වැව තනිවත්, මොරගස්වැව, දෙහිඅත්තාවල හා උණගොල්ලෑව ඒකාබද්ධවත්, තිඹිරිගස්වැව වෙන්වත් ක්‍රියාත්මක වේ. මෙම ගොවි සංවිධාන තුන එල්ලංගා කළමනාකරණ කමිටුව ලෙස එක්ව අදාල රාජ්‍ය නිලධාරීන් සමග නව ප්‍රෙවිශයකට එළඹ ඇත. මෙහි මුලිකම අරමුණ වන්නේ, එල්ලංගා පද්ධතියට අදාලව පවත්නා ගැටළු අදාල රාජ්‍ය ආයතන සම්බන්ධ කරගනිමින් හඳුනා ගැනීමයි. එහිදී, ඇති වන සමාජ ප්‍රශ්න පිලිබඳ අවධානය යොමු කිරීමද එක් අරමුණකි.

4.5.6 එල්ලංගා පද්ධතිය තුල කාන්තාවන් මුහුණ ගටළු හා අභියෝග

වියළි කලාපයේ නිරන්තරයෙන්ම හමුවන කුඩා වැව් එම ප්‍රදේශවල ගෘහාශ්‍රිත භාවිතයට හා වාරි කටයුතු වලට හා වෙනත් ජීවනෝපයන් සඳහා අවශ්‍යම ජලය සපයන ප්‍රධාන මුලාශ්‍රයක් ලෙස එල්ලංගා පද්ධතිය හඳුනාගත හැකිය .

පුරාණ ගම තුල පවුල් තුල හා තම කුටුම්භය තුල සහයෝගය, සහජීවනය, එකිනෙකා අතර අන්තර් සබන්ධතාවයන් හා ආහාර රටාවන් ආදී බෝහෝ දේවල් මෙම එල්ලංගා පද්ධතිය මුලාශ්‍ර කරගෙන පවැති බව ඉතිහාසය පිරික්සීමේදි අවබෝධවන කරුණකි. ඒ තුල සංස්කෘතිමය වටිනාකමක් කෘෂිකාර්මික නැඹුරුතාවයන් තිපුණ නමුත් නව තාක්ෂණය හා මුහුවිමෙන් එදවස පැවති ගති ලක්ෂණ මෙන්ම මානව සිතුම් පැතුම් වෙනස් වීමකට භාජනය වීම නිසා කෘෂිකර්මික රටාවේ වෙනස්කම්, ආර්ථිකය, සෞඛ්‍ය හා පිළිවෙත් වලට එල්ල වී ඇතිබව පෙනේ.

එසේම නවීන තාක්ෂණ ක්‍රම කෘෂිකර්ම කටයුතු සඳහා යහපත් ලෙස උපයොගී කර ගනිමින් මෙම ප්‍රදේශවලට අනගි සම්පතක් වන වැව් ආශ්‍රිත පරිසරය අරක්ෂා කරමින් තම පවුලේ ආර්ථිකමය වශයෙන් ඉහළ මට්ටමකට තම පවුල ගෙන ඒම තුල රටේම දළ ජාතික නිෂ්පාදන ක්‍රියාවලියට ඵලදායි දායකතවයක් ලබා දීමට හැකි වනු ඇත.

මෙහිදී මෙම එල්ලංගා පද්ධතිය තුළ සිටින කාන්තාවන්ට ඉහත ක්‍රියාවලියට වක්‍ර හෝ ඍජු දායකත්වය සැපයීමට බාධක මෙන්ම අභියෝග රැසකට මුහුණ දීමට සිදු වී තිබේ.

මෙම එල්ලංගාවට අයිති ගම්මාන වල හරස්කඩ සංචාරයේදී මෙන්ම ප්‍රජාව සමග කරන ලද සාකච්ඡා වලින් හා අනෙකුත් මුලාශ්‍ර වලින් ලබා ගත් තොරතුරු අනුව මෙම එල්ලංගාව ආශ්‍රිතව ජීවත් වන සියලුම පවුල්වල ප්‍රධාතම ජීවනෝපාය වනුයේ කෘෂිකර්මාන්තයම නොවේ. සංචාරක කර්මාන්තය මුලික කරගත් වෙනස්ම පරිසරයක පිහිටි මෙම එල්ලංගාවේ කාන්තාව වෙනස්ම අභියෝගයන්ට මුන දී ඇත. විශේෂයෙම්ම බොහොමයක් කාන්තාවන් හෝටල් ආශ්‍රිතව රැකියාවන් සඳහා යොමු වී තිබීමත් සමහර නිවාස සංචාරකයින්ගේ කවාතැන් පොලවල් වීම, තවත් සමහර නිවාස වල සංචාරක කර්මාන්තය හා බැදුනු රැකියාවන් වල නියුතු වුවන්ගේ කුලී නිවස්නයන් වීම, බොහොයක් නිවෙස්වල ස්වාමියා දවසින් වැඩි කාලයක් සෆාරි වාහන සමග නිවසින් බැහැරව සිටීම හා මෙම සියලු කුලකයන්ගේ සාමාජිකයන් විදේශිකයන් සමග පවත්වන සමීප සබඳතා මෙම එල්ලංගාවේ කාන්තාවට විශාල අභියෝග ගෙන දී ඇත.

එමෙන්ම මෙම පරිසරය සංචාරක කර්මාන්තය කේන්ද්‍රකරගත් හා කාන්තාව මූලික කරගත් වානිජමය ප්‍රෙද්ශයක් ලෙස අපගේ සංස්කෘතික හර පද්ධතීන් මත ගොඩනැන්වීම සිදුකරන්නේ නම් ඒ සඳහා ස්වර්ණමය අවස්ථාවන් පවතී.

5. එල්ලංගාව මුහුණ දෙන ප්‍රධාන ගැටළු (Cascade Issues)

එල්ලංගාව මුහුන මුහුණදෙන අභියෝග හා ගැටළු ප්‍රමුඛතා ගත කිරිමට එල්ලංගා කළමණාකරන කමිටු එක්ව (Problem Tree) ගැටළු ගස හා සහාභාගීත්ව ක්‍රමවේදය හරහා ගැටළු හඳුනාගත් අතර සහ වගුවේ එය පෙලගස්වා ඇත.

අංකය	උග්‍ර ගැටළුව	විෂය පථය
01	මෙම එල්ලංගාවේ ප්‍රධානම ගැටලුව වනුයේ වැව් රක්ෂිතයන් අහිමි වෙමින් පැවතීමයි. දෙහිඅත්තාවල හා උණගොල්ලැව වැව් වන රක්ෂිතයන්ට මායිම්ව පිහිටීම එහි පැවැත්මට යම් පිටුවහලක් වූවත් අනෙකුත් වැව් රක්ෂිතයන් අහිමිවීමේ තර්ජනය නිරතුරුවම පවතී.	වාරිමාර්ග හා ගොවිජන සේවා පනත්වල ඇති බලතල ක්‍රියාවට නැගීම.
02	ජල පෝෂක ප්‍රෙද්ශය සීමිත වීම හා වැව් රක්ෂිත ආක්‍රමණය කිරීම හේතුවෙන් වැව් ජල ධාරිතාවය පවත්වාගෙන යාමට නොහැකිව ජලය ඉවත් කිරිමට සොරොව් විවෘත කිරීමට සිදුවීම. මේ කරුණු හේතුවෙන් ජලය හිග වීමේ ගැටලුව පවතීම හා වැව් රක්ෂිත ආක්‍රමණය වලකා ගැනීමට වැව් වල සීමාවන් ලකුණු කර නොතිබීම.	වාරිමාර්ග හා ගොවිජන සේවා පනත්වල ඇති බලතල ක්‍රියාවට නැගීම.
03	තිඹිරිගස්වැව වාන් වතුර කුඹුරු බිම් හරහා වැටී තිබීම. මේ හේතුවෙන් වැසි කාලයේදී සිදුවන වගා හානි	වාරිමාර්ග
04	එල්ලංගාවේ බොහොමයක් වැව් වනාංතර වලට මායිම්ව පිහිටා තිබීම නිසා නිතර සිදුවන අලි මිනිස් ගැටුම.	අලි මිනිස් ගැටුම
05	එල්ලංගාවේ සියළුම ගොවි බිම් වර්ෂාව උපයෝගී කරගෙන මාස් කන්නයේදී වගා කිරීම සිදු නොවීම. සම්මත වැව් යටතේ වගා කටයුතු සිදුවනුයේ වැවට ජලය ලැබුනායින් පසුවය. මේ නිසා වර්ෂාව නතර වී මාස දෙකකට අධික කාලයක් වැවෙන් ජලය ගෙන වගා කටයුතු සිදුකිරීම ගැටලුවකි.	වගා තීව්රතාවය (Crop Intensity) පහළ අගයක පැවතීම.
06	එල්ලංගාවේ ක්‍රියාත්මක ගොවි සංවිධාන වල ක්‍රියාකාරීත්වය, පද්ධතිය නඩත්තු කිරීමට තරම් දැනුවත් භාවයෙන් තොරවීම සහ මූල්‍යමය වශයෙන් දුර්වල තත්වයක පැවතීම.	ආයතන සංවර්ධනය
08	ගොවි සංවිධාන වලට පවතින බලතල හා ජල කළමණාකරණය පිළිබඳව දැනුම අල්ප වීම. මේ නිසා කන්න රැස්වීම් තීරණ ක්‍රියාත්මක කිරීමේ සිට ජල කළමණාකරණයට අදාල සියලු මැදිහත්වීම් අඩාල වී ඇත.	ජල කළමණාකරණය
09	වර්ෂාපතන රටාවන්, පාංශු සංයුතිය, ජලය කාන්දු වීම් යනාදි සාධක පිළිබඳ පවතින දැනුම හා භාවිතය අවම වීම	ජල කලමනාකරණය
පාරිසරික ගැටලු		
01	කාබනික ද්‍රව්‍ය හා නිවැසියන්ගේ සහා හෝටල් වල අපද්‍රව්‍ය වැව් ජලය හා මිශ්‍ර වීමෙන් වැව් ජලය දූෂිත වීම සිදුවෙමින් පවතී.	ප්‍රාේදශීය සභාව
02	වැව් රක්ෂිත සීමා සලකුනු කර නොමැති නිසා අනවසර ගොඩනැගිලි හා වගාවන් සඳහා අනවසරයෙන් අත්පත් කර ගැනීම (කඩහත වැව, මොරගස්වැව හා තිඹිරිගස්වැව)	

03	වැව් පරිසර පද්ධතියේ සංරචක වන කට්ටකාඩුව, ගස්ගොම්මන, පෙරහන කිවුල් ඇළ වැනි ව්‍යූහයන්ට හානිකර ඇති නිසා ජලය වාෂ්පීකරණය ඉහළ යාම, පෝෂක ප්‍රදේශය ලවණතාවයට භාජනය වීම, රොන්මඩ තැන්පත් වීම ඉහළ යාම වැනි අහිතකර තත්ත්වයන් වර්ධනය වීම.	වාරිමාර්ග
04	නිදැල්ලේ හැසිරෙන ගව රංචු වන රක්ෂිතවලට ඇතුළ් වී තණකොළ උලාකෑම, වන සංරක්ෂණ ප්‍රදේශවල ප්‍රමාණවත් ආහාර නොතිබීමත්, වන අලි ගහනය ඉහළ යාමත් නිසා වන අලි ගම්මානවලට සංචරණය වීම ඉහළ යාම නිසා වගා හානි, දේපළ හානි සහ වැව් බැමි හා ඇළ වේලි පද්ධතීන්ට හානි සිදු කිරීම.	වන ජීවී
05	වන සතුන් ඉලක්ක කර තුවක්කු බැඳීම /කදන් බැඳීම හා වෙඩි තැබීම මඟින් සතුන් දඩයම් කිරීමට පිරිසක් පෙළඹී සිටීම.	වන ජීවී

6. එල්ලංගා පද්ධති කළමණාකරණ සැලැස්ම.

6.1 මූලික පරමාර්ථ

6.1.1 ඉහල යාංඔය එල්ලංගාවේ පවතින වැව් හා ඊට අදාල භූමියේ තිරසාර පැවැත්ම සහතික වන අයුරින් එක් පද්ධතියක් ලෙස සාමූහිකව කටයුතු කිරීම.

6.1.2 අරමුණු

i. දේශගුණ සුහුරු ආකල්ප හා භාවිතයන් වෙත ගොවීන් යොමු කිරීම.
ii. ජලාධාර ප්‍රදේශය, වැව හා පෝශක ප්‍රදේශය එක් පද්ධතියක් ලෙස ක්‍රියාත්මක කිරීම.
iii. එල්ලංගා පද්ධතිය තුළ සිදුවන පාරිසරික හානිය අවම කිරීම.
iv. එල්ලංගාව පැවති පාරිසරික පද්ධතිය නැවත ගොඩනැගීම.
v. වගා තීව්‍රතාවය (Crop Intensity) ඉහළ දැමීම.
vi. පාංශුඛාදනය අවම කිරීම හා රොන්මඩ තැන්පත් වීම වලකාලීම.
vii. ජල කළමණාකරණය විධිමත් කිරීම.
viii. එල්ලංගාව කළමණාකරණය සඳහා ශක්තිමත් සංවිධාන ව්‍යූහයක් ගොඩනැගීම හා එහි තිරසාර පැවැත්ම තහවුරු කිරීම.
ix. අලි මිනිස් ගැටුම අවම කිරීමට දායක වීම.

6.2 එල්ලංගා පද්ධති කළමණාකරණ සැලැස්ම

හරස්කඩ චාරිකාව හා ද්විතියික දත්ත ආශ්‍රයෙන් ගොඩනග ලද එල්ලංගාවේ පැතිකඩ නිර්මාණයේදී හඳුනාගත් ගැටළු හා විද්‍යාත්මක පදනමින් පෙලගස්වන ලද ගැටලු පිළිබඳ ප්‍රමුඛතාවය අනුව එල්ලංගා කළමණකෙරණ සැලැස්ම සකස් කිරීම සඳහා වන විසඳුම්, හඳුනාගැනීම්, පළවන පියවරේදී කරන ලදි.

ඉන් අනතුරුව එම ගැටළු විසඳීමේ කෙටිකාලීන හා දිගුකාලීන ප්‍රවේශයන් හඳුනාගෙන එල්ලංගා පද්ධති කළමණාකරණ සැලැස්ම සකස් කරන ලදි.

ඒ අනුව හඳුනාගත් හා පෙලගැස්වූ ගැටලු ලැයිස්තුව හා එම ගැටළු විසඳීම සඳහා වූ ප්‍රධාන ක්‍රියාකාරකම් පහත වගුවේ දැක්වේ.

අනු අංකය	අරමුණ	ප්‍රධාන ක්‍රියාකාරකම්
01	වැව් තාවුලු (රක්ෂිත) ආරක්ෂා කර ගැනීම.	1.1 වැව් රක්ෂිත ලකුණු කර මායිම් කණු යෙදීම
02	තිඹිරිගස්වැව වාන් වතුර මගින් සිදුවන වගාහානි අවම කිරීම	2.1 වාන් ඇල පලල් කර පිලිසකර කිරීම.
03	පරිසරහිතකාමී සංචාරක කලාපයක් ගොඩනැගීම.	1.1 සංචාරක කර්මාන්තය හා බැඳුනු අවස්ථාවන් හඳුනා ගැනීම 1.2 පරිසරය ආරක්ෂා කරගත් සංචාරක කර්මාන්තයක තිරසාර පැවැත්ම පිළිබඳව ප්‍රජාව දැනුවත් කිරීම. 1.3 ලෝක උරුමයක් වන එල්ලංගා පද්ධතිය හා බැඳුනු සංචාරක පරිසරයක් ගොඩනැගීම හා එහි පවතින ආර්ථික ප්‍රතිලාභයන් සාමුහිකව භුක්ති විඳීමට පවතින අවස්ථාවන් පිළිබඳව දැනුවත් කිරීම 1.4 එම පරිසරය ගොඩනැගීම හා ආරක්ෂා කර පවත්වා ගැනීමට ප්‍රජාව තුලින්ම සංවිධාන ගොඩ නැගීම.
07	වැසි ජලය උපරිම ලෙස ප්‍රයෝජනයට ගෙන වී වගා කිරීමට(Early Maha) ගොවි සංවිධාන පෙළඹවීම	I. එල්ලංගා වේ පවතින ගොවි සංවිධාන තුනේ සාමාජිකයන් පෙර වර්ශාපතන දත්ත හා ඔවුන්ගේ ප්‍රයෝගික අත්දැකීම් සාකච්ජා කර වර්ශාවත් සමග බිම් සකස් කර ගොවිතැන් සඳහා යොමුවීමේ ඵලදායීතාවය දැනුවත් කිරීම.

		II. කන්න රැස්වීමට පෙර එල්ලංගාවේ ගොවි සංවිධාන එක්ව පෙර කන්න රැස්වීමේදී තීරණ ගැනීම. III. කන්න රැස්වීමේදී වර්ශාව සමග වගා කටයුතු ආරම්භ කිරීමට ගොවීන් පොළඹවා ගැනීම, තීන්දු ගැනීම සහ එම තීන්දු ක්‍රියාත්මක කිරීම. IV. වර්ශාවන් සමග ගොවිතැන් කර ජනවාරි හා පෙබරවාරි මාසයේ අස්වනු නෙලන වගා බිම් සඳහා අතරමැදි කන්නයක් සඳහා ගොවියන් උනන්දු කරලීම
08	එල්ලංගාවේ ගොවි සංවිධාන ශක්තිමත් කිරීම	I. ගොවි සංවිධාන වල ශක්තිය වැඩි කිරීමට පුහුණු වැඩසටහන් පැවැත්වීම. II. ගොවි සංවිධාන වල නීතිමය බලය, කන්න රැස්වීමට ඇති නීතිමය වටපිටාව පිළිබඳව පුහුණුව ලබාදීම. III. ගොවි සංවිධාන වල මූල්‍ය තත්වය වර්ධනය සඳහා උපාය මාර්ගික සැලසුම් සකස් කිරීමට උනන්දු කිරීම හා දැනුවත් කිරීම. උදා: නඩත්තු අරමුදල් ගොඩ නැගීම සහ ධීවර වැඩසටහන් ක්‍රියාත්මක කිරීම යනාදිය.
09	ගුනාත්මක භාවයෙන් ඉහල බීජ භාවිතය සඳහා ගොවියන් උනන්දු කිරීම.	II. සෑම යල කන්නයකම තෝරාගත් වැව් කිහිපයක බීජ ගොවිපලවල් ඇති කිරීමට ගොවියන් සහ ගොවි සංවිධාන උනන්දු කරවීම. III. බීජ ගොවිපලවල් ඇති කිරීම සඳහා උපදේශන, බීජ ලබා දීම හා එය මෙහෙය

		වීම සඳහා ක්‍රමවේදයක් සකස් කිරීමට උපදෙස් ලබා දීම.
10	එල්ලංගාවේ පාරිසරික පද්ධතිය සංරක්ෂණය සඳහා එල්ලංගා කළමනාකරණ කමිටුව භාවිතා කිරීම	I. එල්ලංගාවේ වගකීම දරන සියලු රාජ්‍ය ආයතන, ප්‍රජා මූල සංවිධාන හා ගොවි සංවිධාන එල්ලංගා පද්ධතිය සංරක්ෂණ සඳහා සාමූහික ප්‍රයත්නයක් ගන්නා තැනට දැනුවත් කිරීම, සාමූහිකත්වය ගොඩ නැගීම හා එක අරමුණක් කරා කණ්ඩායමක් ලෙස ක්‍රියාත්මක වීමට ගොඩ නැගීම.
11	ජල භාවිතයේ ඵලදායීතාවය නන්වාලීම	I. ජල කළමනාකරණ සැලැස්මක් සකස් කිරීම, ක්‍රියාත්මක කිරීම, ජල මැනුම් කිරීම, පංගු ලැයිස්තු සකස් කිරීම, ජලය වාෂ්පීකරණය හා පොලොවට කාන්දු වන ප්‍රමාණය ගණනය, පාංශු වල තත්වයන් හා බෝග වලට අවශ්‍ය ජල ප්‍රමාණය පිළිබඳව පුහුණුව ලබා දීම. II. ජල කළමනාකරණ කමිටුවක් ගොවි සංවිධානය යටතේ ස්ථාපිත කිරීම. III. වැව් වල ජල මාපක සටහන් සවි කිරීම හා ඒ අනුව ජල ධාරිතාවය ගණනය කිරීමට හුරු පුරුදු කිරීම. IV. ඇලවල් වල ජලය මැනීමට හුරු කිරීම හා ඒ අනුව ජලය මුදා හැරීම.
12	ගොවි සංවිධාන සතු බලතල පිළිබඳව දැනුවත් කිරීම	I. ගොවිජන සේවා පනත, කන්න රැස්වීම් වල බලතල හා එල්ලංගා පද්ධති කළමනාකරණය පිළිබඳව චක්‍ර ලේඛන ගැන දැනුවත් කිරීම. II. අදාල ලියකියවිලි ලබා දීම

6.3 ඉහල යාංඔය එල්ලාංගා පද්ධතියේ කෘෂිකර් ම සැලැස්ම

ඉඩම් පරිහරණ රටාව

Land use Pattern	Ha	%
Paddy Lands - Dehiaththawala & Unagollewa	13	2.95%
Paddy Lands - Moragaswewa	13.7	3.11%
Paddy Lands - Kadahathawewa	17	3.85%
Paddy Lands - Thimbirigaswewa	8.5	1.93%
Forest	200	45.35%
Tank bed - Dehiaththawala	7.35	1.67%
Tank bed - Unagollewa	7.38	1.67%
Tank bed - Moragaswewa	14.2	3.22%
Tank bed - Kadahathawewa	12.4	2.81%
Tank bed - Thimbirigaswewa	5.22	1.18%
Residence or High Land	298.75	67.74%

මෙම එල්ලාංගා පද්ධතියට අයත්වන මුලු භූමි ප්‍රමානය හෙක්ටයාර් 597 ක් වන අතර එයින් 50.01% හෙක්ටයාර් 298.75 ක් ගොඩබිම් වන අතර ඉන් 80% පමණ ගෙවතු, නේවාසික හෝ ව්‍යාපාරික ඉඩම්ය. 33.47% හෙක්ටයාර් 200 ක් පමණ වනාන්තර වන අතර වී වගා කරන තෙත්බිම් ප්‍රමානය හෙක්ටයාර 52.2 මුලු බිම් ප්‍රමාණයෙන් 8.73% වන අතර වැව් 5 වසින් ජලය රඳවා ගන්න ප්‍රෙද්ශය මුලු බිම් ප්‍රමාණයෙන් 7.79% ක් එනම් හෙක්ටයාර් 46.55 කි.

හෙක්ටයාර් 52.2 තෙත්බිම් ප්‍රමානය මහ කන්නයේදි මුලු මනින්ම වි වගාව සඳහා භාවිතා කරයි. මෙම භූමි ප්‍රමානය වැව් පුනරුත්ථාපනය කලා වුවද වගා බිම් ප්‍රමාණය වැඩිකිරීමට හැකියාව නැත. අර්ධ නාගරික ප්‍රෙද්ශයක් වන බැවින් ක්‍රමයෙන් ඉඩම් කැබලි වීමත් සමග වගා බිම් අටුවීමේ අවධානම පවතී. මේ නිසාම සාර්ථක ගෙවතු දකින්නට ඇතත් යල කන්නයේ ගොඩබෝග වගාව කරනුයේ සුලු වශයෙනි.

යල කන්නය සඳහා බෝග රටාවන් තෙරීමේදී තාර කික විය යුතු අතර ඒ සඳහා ජල කලමනාකරණ අයායතන භාවිතා කරන සංකල්ප සහ මුලධර් ම භාවිතා කර ගනනය කරගන්නා ලද පහත සඳහන් දත්තයන් භාවිතාකර එනම්

- මාසික සමාන්‍ය වර් ෂාපතනය
- අදාල ජලදහරා ප්‍ර දේශයේ මාසික ජල අපදාවය
- වැවට අදාල ප්‍රධාන ජල ධාරාව

WEAP Schematic and Scenario Analysis මගින් පහත දත්තයන්

- අදාල වැවේ පුනුරුත්තාපනයට පෙර ජල ධාරිතාව
- අදාල වැවේ පුනුරුත්තාපනයට පසු ධාරිතාව සහ ජල සැපයුම
- ජල ඉල්ලුම
- බෝග වගා ප්‍රතිශතය
- ජල සැපයුම් විශ්වාශනියතත්ව ප්‍රතිශතය
- ආර් ථික ඵලදායිතාව ප්‍රතිශතය
- වැවෙන් බලාපොරොත්තු වියහැකි සැපයුම් ප්‍රතිශතය

සොයාගෙන අදාල ආර් ථික ඵලදායි සහ ජල ඵලදායි බෝග රටාව තිරණය කරනු ලැබේ.

1.මහ කන්නයේ වී වගාව ,මාස 3-3 1/2 වර් ගය

2.යල කන්නය - වී වගාව මාස 3 වර් ගය

3.යල කන්නය -මුං ,කව්පි. .එලවලු

4.යල කන්නය-මුං කව්පි,බි ලූනු ,මිරිස්

5. යල කන්නය-මුං ,කව්පි,බඩ ඉරිගු,

6. යල කන්නය-මුං තව්පි,බඩඉරිගු ,මිරිස් බි ලූනු එල

	වගුව 1- දේශගුනික සුහුරු වාරි කෘෂි ව්‍යාපාතිය මගින් වැව් පුනුරුත්තාපනය කල පසු යෝජිත බෝග රටාව										
අනු අංක	වැව	කුඹුරු වගා බිම් ප්‍රමාණය (හෙක්)	ගොවි පවුලු ගනන	යල කන්නයේ බෝගවිවිධාංගිකරණය කිරීමට යෝජිත බෝග වර් ගය සහ රටාව							මහ කන්නය යෝජිත බෝගය
				මුං	බඩඉරිගු	කව්පි	බි ලූනු	මිරිස්	එලවලු	යල වී	වී
1	දෙහි අක්තාවලවැව	8	40								
2	උනගොල්ලාව වැව	11	22								
3	මොරගස්වැව	22.6	63								
4	තිඹිරිගස්වැව	16	38								
5	කඩහත වැව	18.8	45								
6	ගලෙන්බිදුනුවැව	30	34								
7	පුරාන ඉලුක්වැව	15	35								
8	ගලින්ද මහවැව	42	39								
9	අන්ගුලාන් වැව	24.8	17								
10	ගලින්ද කුඩාවැව	15	7								
11	නිකපිටිය වැව	38	43								
		241.2	**383**								

ප්‍රතිසංස්කරණය කරන වැව්

මහ කන්නයේ වී වගාව ගොවියාගේ ආර්ථිකයේ ප්‍රධාන තැනක් ගනී .ඒ සඳහා වැඩි ඵලදායිතාවයක් ලබා ගැනිම සඳහා දේශගුනික සුහුරු කෘෂි ක්‍රියාකාරකම් පහත වගුවේ ආකාරයට සැලසුම් කරනු ඇත

යලකන්නය ගතහොත් මුලික ජල කළමනාකරණ ගනනයන්ට අදාලව ජලය ප්‍රයෝජනවත් ලෙස යොදා ගැනිම සඳහා එල්ලාංගා කළමනාකරණ කමිටුවේ අනුමැතිය අනුව බෝග රටාව තේරීම සහ වී වගා කලයුතු ප්‍රමානයන් සළකා බැලේ .ඒ අනුව දේශගුනික සුහුරු කෘෂි පිළිවෙත් අනුගතකිරිම සඳහා පහත ක්‍රියාකාරකම් කන්නයට සාපේක්ෂව හා උස්බිම් වගාව සඳහා යොදා ගැනේ.

- එනම් යල කන්නයේ කුඹුරු ඉඩම් තුල අතිරේක අහාර බෝග වගාව සහ අතරමැදි කන්නයේ මුං වගාව ප්‍රධාන තැනක් ගනි.මෙහිදි නියං ප්‍රතිරෝධි ,කෙටිකාලින ප්‍ර බේද,රෝග ප්‍රතිරෝධී ප්‍ර බේද බිජ ලබාදේ.
- ගොඩ සහ මඩ ඉඩම් සඳහා කාබනික ද්‍රව්‍ය කොල පොහොර බෝග අවශේෂ වසුන්ලෙස යොදා ගැනිම ,සන්හෙම්ප් වැනි රනිල බෝග වගා කර පසට යෙදීම වැනි ක්‍රායාකාරකම් ඇතුලත්ය
- වී වගාව සඳහා බිජ මාස 3-3 ½ සහ වැඩි දියුණු කල බිජ ලබා ගැනිම උනන්දු කරවිම සහ සුහරු කෘෂි ක්‍රියාකාරකම් කිරිම සඳහා සහන ලබාදේ.
- ගෙවතු සඳහා වැඩි හරිත අවරණයක් සහිත ,වැඩි ආර් ථික ප්‍රතිලාභ අත්කරගත හැකි පළතුරු බෝග සහ පොල්වැනි අත්‍යාවශ්‍ය බෝග පැල ලබාදිම මගින් කෘෂී වනාන්තර සංකල්පය ක්‍රියාවට යොදවයි.
- පස සෝදා යාම වලක්වා ගැනිමට පාශු සංරක්ෂණ වැටි යෙදීම සහ අගල් කානු කැපිම සහ පසට වසුන් යෙදිම සහ අවම බිම් සැකැස්ම වැනි ක්‍රම යොදා ගැනේ.
- මෙම ක්‍රියාකාරකම් ප්‍රවර්ධනය සහ තාක්ෂණික දැනුම ලබා දිම සඳහා පුහුනු වැඩසටහන් 26 ක් සංවිධානය කරනු ඇත.

6.4 එල්ලංගා පද්ධති කළමනාකරණ කමිටු සැලැස්මේ හඳුනා ගත් ගැටළු සහ සමාජ ආරක්ෂණ මැදිහත් වීම

එල්ලංගා පද්ධති කළමනාකරණ කමිටු සැලැස්ම සැකසීමේ මූලික පියවරක් ලෙස හරස්කඩ චාරිකාව තුලින් සිදු කල ගවේෂණය තුලින් සාමාජීය වශයෙන් මූලිකවම අපේක්ෂා කරනු ලබන්නේ, එල්ලංගා පද්ධතිය තුල සමාජීය සංවර්ධනය සඳහා මහ පෙන්වීමයි. එහිදී, සමාජීය වශයෙන් එල්ලංගා පද්ධතිය පිලිබඳ පවතින සමාජ ගැටළු, වැඩි අවධානයක් යොමු කල යුතු කරුණු, ගැටළු විසදීමට භාවිතා කල හැකි ක්‍රමවේදයන් පිළිබඳව මෙහිදී කරුණු විමසා බැලේ.

එල්ලංගා පද්ධතිය සහ ගොවි සංවිධානය අතර විශාල බැඳීමක් පවතී. එය සමාජීය වශයෙන් ඉතාමත් ශක්තිමත් බැඳීමකි. මෙහි මූලිකම අරමුණ වන්නේ, එල්ලංගා පද්ධතියට අදාලව පවත්නා ගැටළු අදාල රාජ්‍ය ආයතන සම්බන්ධ කරගනිමින් හඳුනා ගැනීමයි. එහිදී, ඇති වන සමාජ ප්‍රශ්න පිලිබඳ අවධානය යොමු කිරීමද එක් අරමුණකි.

6.5 එල්ලංගා පද්ධති කළමනාකරණ සැලැස්ම



ඉහත සටහනින් දැක්වෙන පියවරයන්ගෙන් පසුව කළමනාකරණ සැලැස්ම එළිදැක්වෙන අතර, පහත දැක්වෙන වගුවේ එම සැලැස්ම විස්තරාත්මකව දැක්වේ.

6.6 එල්ලංගා කළමනාකරණ සැලැස්ම ක්‍රියාත්මක කරන ආකාරය

කළමනාකරණ සැලැස්ම එලිදැක්වීම සඳහා CSIA ව්‍යාපෘතිය විසින් සකස් කරගත්තා වූ සහභාගිත්ව ප්‍රවේශය හා ඒ සඳහා පසුකරන ලද පියවරයන් පිළිබඳව ඉහත සටහන මඟින් විස්තර කරන ලදී.

මෙම සැලැස්ම සකස් කිරීමට පාර්ශව ගණනාවක් සම්බන්ධ කරගැනීමේ අරමුණ වනුයේ 2024 ජූනි මස CSIA ව්‍යාපෘතිය අවසාන වීමෙන් පසුවත් එය තිරසාර ලෙස ක්‍රියාත්මක වීමට නම් මෙම සැලැස්ම සියලුම පාර්ශවයන්ගේ දායකත්වය ඇතිව සකස් වන සැලැස්මක් විය යුතුය.

2024 ජුනි මස දක්වා වසරක කාලය තුල මෙම සැලැස්ම ක්‍රියාත්මක කිරීමට අවශ්‍ය යටිතල පහසුකම් CSIA ව්‍යාපෘතිය මගින් සපයන අතර මෙම කාලය තුල එහි පදනම ශක්තිමත් කිරීමටත් නීතිමය රාමුව සකස් කිරීමටත් මැදිහත් වනු ඇත. එල්ලංගා කලමනාකරණ කමිටුව තිරසාර ලෙස ක්‍රියාත්මක වීමත් මෙම සැලැස්ම යාවත්කාලීන වෙමින් අඛණ්ඩව ක්‍රියාත්මක වීමට අවශ්‍ය පදනම ශක්තිමත් කිරීමත් ව්‍යාපෘතියේ අරමුණ වේ.

ඒ අනුව එම කළමනාකරණ සැලැස්මට අදාල උප ව්‍යාපෘතියන් සඳහා එල්ලංගා කළමනාකරණ කමිටුව නියෝජනය කරන හවුල්කාර පාර්ශවයන්ගේ සහය ඇතිව සංකල්ප පත්‍රිකා හෝ උප ව්‍යාපෘති වාර්තාවන් සකස් කර මූල්‍ය ආධාර ලබා ගැනීම සඳහා අරමුදල් සම්පාදනය කරන ආයතන වලට ඉදිරිපත් කල යුතුය. මෙම උප ව්‍යාපෘති සකස් කිරීමේදී ඒ ඒ විෂයන්ට අදාල ප්‍රධාන හවුල්කාර පාර්ශවයන් ,තාක්ෂණ සැලසුම්, ඇස්තමේන්තු, පිළිවිතරයන්, ක්‍රමවේදයන් සකස් කර එල්ලංගා කළමනාකරණ කමිටුවට සහය ලබා දිය යුතුය.

CSIA ව්‍යාපෘතිය සෑම ක්‍රියාකාරකමක්ම විගණනය සඳහා එහි ප්‍රතිලාභීන් දායක කර ගන්නා අතර මෙම උප ව්‍යාපෘතීන් සඳහාද සාමාජීය විගණනය කිරීමට සමාජ විගණන කමිටු ස්ථාපිත කල යුතුය.

6.7 එල්ලංගා පද්ධති කළමනාකරණ සැලැස්ම ක්‍රියාත්මක කිරීමේ කාලරාමුව

අං	උග්‍ර ගැටළු විසඳීම සඳහා යෝජිත උපායමාර්ගික මැදිහත්වීමේ ප්‍රධාන ක්‍රියාකාරකම්	දළ පිරිවැය (රු.මි.)	කාලරාමුව											ක්‍රියාත්මක කිරීමේ වගකීම දරන ආයතන	
			කෙටිකාලීන 2024			මධ්‍ය කාලීන 2024		දිගුකාලීන 2025				2026		ප්‍රධාන	අනෙකුත්
			මාර්තු	මැයි	ජූනි	3 කා:	4 කා:	1 කා:	2 කා:	3 කා:	4 කා:	1 කා:	2 කා:		
01	වැව් තාවුලු (රක්ෂිත) ආරක්ෂා කර ගැනීම														
	අ) වැව් රක්ෂිත ලකුණු කර මායිම් කණු යෙදීම	**2.00**												වාරිමාර්ග දෙපාර්තමේන්තුවේ තාක්ෂණික කණ්ඩායම & DAD	**IDCBS**
02	තිඹිරිගස්වැව වාන් වතුර මගින් සිදුවන වගාහානි අවම කිරීම														
	අ) ගොවීන් සමග රැස්වීමක් පැවැත්වීම													**IDCB & DAD**	වාරිමාර්ග දෙපාර්තමේන්තුවේ තාක්ෂණික කණ්ඩායම
	ආ) ආස්තමේන්තු සකස් කිරීම													**WMS**	
	ඇ) ප්‍රසම්පාදන කටයුතු සිදුකර වාන් ඇල පලල් කර පිළිසකර කිරීම	**2.00**												**IDCB, WMS & FO**	
03	පරිසරහිතකාමී සංචාරක කලාපයක් ගොඩනැගීම														
	3.1 SWOT Analysing	**0.01**													
	3.2 ප්‍රජාව දැනුවත් කිරීම.														
	3.3 අනුකමිටුවක් ගොඩනැගීම	**0.01**													

	3.4 ඔවුන් පුහුණු කර ක්‍රියාත්මක කිරීම	0.08													
04	ගොවි සංවිධාන සතු බලතල පිළිබඳව දැනුවත් කිරීම														
	අ) DAD නිලධාරීන් සහා AFලා දැනුවත් කිරීම	0.01													
	ආ) දැනුවත් කිරීම (පුහුණුව ලබාදීම)	0.02													
05	ජල කලමනාකරණය හඳුන්වාදීම														
	අ) පුහුණු වැඩ සටහන් පැවැත්වීම	0.02												WMS & TO	AF & FO
	ආ) ප්‍රායෝගික වැඩසටහන් සිදුකිරීම	0.01												TO	AF & FO
06	වැව් ජලය උපරිම ලෙස ප්‍රයෝජනයට ගෙන වී වගා කිරීමට(Early Maha) ගොවි සංවිධාන පෙළඹවීම	0.10												IDCBS & CSAF	DAD, Safeguard Team & AF
10	එල්ලංගාවේ පාරිසරික පද්ධතිය සංරක්ෂණය සඳහා එල්ලංගා කළමනාකරණ කමිටුව භාවිතා කිරීම	.10												IDCBS & ESO	SSO & AF
	එකතුව	4.36													
6.8	**පාරිසරික සැලැස්ම**	1.70													
	මුලු එකතුව	6.06													

6.8 පාරිසරික සැලැස්ම ක්‍රියාත්මක කිරීමේ කාලරාමුව

අං	උග්‍ර ගැටළු වසඳීම සඳහා යෝජිත උපායමාර්ගික මැදිහත්වීමේ ප්‍රධාන ක්‍රියාකාරකම්	දළ පිරිවැය (රු.මි.)	කාලරාමුව												ක්‍රියාත්මක කිරීමේ වගකීම දරන ආයතන	
			කෙටිකාලීන 2024			මධ්‍ය කාලීන 2024		දිගුකාලීන 2025				2026			ප්‍රධාන	අනෙකුත්
			මාර්තු	මැයි	ජූනි	3 කා:	4 කා:	1 කා:	2 කා:	3 කා:	4 කා:	1 කා:	2 කා:			
01	වැව් පද්ධතිය තුල ඇති ජීව කාලය අවසන් වෙමින් පවතින හෝ ඉදිරි වැටී ඇති හෝ මැරී ඇති ගස් ඉවත් කිරීම සඳහා විධිමත් ක්‍රමවේදයක් සැකසීම.	0.10		■	■										ගොවිජන සංවර්ධන දෙපාර්තමේන්තුව ප්‍රාදේශීය ලේකම් කාරයාලය	ගොවි සංවිධාන
02	වැව් පරිසර පද්ධතියේ එක් එක් සංරචකයන්ගේ වැදගත්කම එය ආරක්ෂා කිරීමේ වාසි හා එල්ලංගා පද්ධතියේ විකාශණය පිළිබඳ පාසැල් සිසුන් ඇතුළු ග්‍රාමීය ප්‍රජාව දැනුවත් කිරීම	0.10			■										ගොවිජන සංවර්ධන දෙපාර්තමේන්තුව පළාත් වාරිමාර්ග දෙපාර්තමේන්තුව	ගොවි සංවිධාන
	ප්‍රතිලාභීන්ගේ දායකත්වය ඇතිව වැව්පරිසර පද්ධතින් හි කට්ටකාඩුව, කිවුල් ඇළ, ගස්ගොම්මන, පෙරහණ වැනි සංරචක ප්‍රතිස්ථාපනය කිරීම	0.50				■	■								ගොවිජන සංවර්ධන දෙපාර්තමේන්තුව පළාත් වාරිමාර්ග දෙපාර්තමේන්තුව	ගොවි සංවිධාන
	සියලු වැව් වල රක්ෂිත මායිම් ලකුණු කිරිම	1.00		■	■										ගොවිජන සංවර්ධන දෙපාර්තමේන්තුව පළාත් වාරිමාර්ග දෙපාර්තමේන්තුව පරිසර පොලිස් ඒකකය	ගොවි සංවිධාන
	එකතුව	1.70														

7. ජල කළමනාකරණය

ඇමුණුමක් ලෙස දක්වා ඇත.

8. සැලැස්ම මඟින් අරමුණු ඉටුවේද යන්න ඇගයීම

එල්ලංගා පද්ධති කළමනාකරණ සැලැස්ම සකස් කිරීමේදී පිහිටුවා ගත් අරමුණු, හඳුනා ගත් උග්‍ර ගැටළු විශ්ලේෂණය කර එම ගැටළු විසඳීමට හා අරමුණු කරා ලඟා වීමට මෙම සැලැස්ම සමත් වූයේද යන්න ඇගයීමක් කිරීම සඳහා පහත ප්‍රධාන කාර්ය සාධක (KPI) Key performance indicators භාවිතා කරනු ඇත. ඕනෑම සැලැස්මක් නියමිත අරමුණු කරා යන්නේදැයි පසු විපරම් කිරීමට නිශ්චිත සංධිස්තාන milestone නිශ්චය කර ගත යුතුය.

KPI සහ milestone මොනවද යන්න පහත පෙළගස්වා ඇත.

8.1 ප්‍රධාන කාර්ය සාධක - KPI

8.1.1 වගා තීව්‍රතාවය Crop Intensity

8.1.2 ඉඩම් ඒකකයක ජල කාර්යක්ෂමතාවය Water Duty per Acer

8.1.3 Promoting Eco System

- Improving number of events in the Eco System

8.1.4 Activation of CMC

- No of Meetings per year
- No of implementing activities of taken decision
- Volume of Maintenance Funds

8.1.5 Protective Catchment Area

- Forming the Soil Conservation Bund (Acs)
- Application to Protect Soil Conservation Bund (Number of Applications)

8.1.6 CSA Practices

- Implementing No of CSA Practices
- Percentage the Extent area of CSA Practices of Total Area

8.2 නිශ්චිත සංධිස්තාන - Milestone

8.2.1 Commencing intervention of CMC – 1st of Mar. 2024

8.2.2 Training for Members of CMC – Before 31st Mar. 2024

8.2.3 Implementing Water Management System – Maha Season of 2024/25

8.2.4 Commencing to held Pre-Cultivation Meeting – Maha Season of 2024/25

8.2.5 Commencing to rehabilitate the Eco System – 1st Oct. 2024

9. ඇමුනුම්

01 - ගොවිජන සංවර්ධන දෙපාර්තමේන්තුව විසින් එල්ලංගා කලමණාකරන කමිටු පිහිටුවීම සම්බන්ධයෙන් නිකුත් කර ඇති 2023.08.03 දිනැති අංක 6/ 2023 දරන චක්‍ර ලේඛය

ගොවිජන සංවර්ධන දෙපාර්තමේන්තුව
கமநல அபிவிருத்தித் திணைக்களம்
DEPARTMENT OF AGRARIAN DEVELOPMENT

මගේ අංකය எனது இல. My No.	7/3/9/CMC/2023	ඔබේ අංකය உமது இல. Your No.		දිනය திகதி Date	2023.08. 03

චක්‍රලේඛ අංකය - 06/2023

සියලුම දිස්ත්‍රික් ලේකම්වරුන් සහ ප්‍රාදේශීය ලේකම්වරුන් වෙත,

ඇල්ලංගා පද්ධති කළමනාකරණ කමිටු පිහිටුවීම හා පවත්වා ගෙන යාම.
Cascade Management Committee (CMC) Establishment & Continuity

රට අභ්‍යන්තරයේ සිට මුහුදට ගලා බසින ප්‍රධාන ගංගා (Rivers) තෘතියික ජල මාර්ග ලෙසත්, එම ප්‍රධාන ගංගා වලට එකතුවන අතු ගංගා (Tributarite) ද්විතීක ජල මාර්ග ලෙසත්, එම අතු ගංගා වලට ජලය සපයන කුඩා ජල මාවත් (Small water ways) ප්‍රාථමික ජල මාර්ග ලෙසත් හැඳින්වේ. ග්‍රාමීය වැව් හා අමුණු වැඩි ප්‍රමාණයක් ප්‍රාථමික ජල් මාර්ග හරහා ඉදිකර ඇති අතර භූමිය මතුපිට ජලය ගබඩා කර පහළට ගලා යාමට සැලැස්වීමට සකස් කර ඇති වැව් ද මීට ඇතුළත් වේ.

02. මෙරට අභ්‍යන්තරයේ පවතින ප්‍රාථමික ජල මාර්ගයක් හෝ ප්‍රාථමික ජල මාර්ග ජාලයක පිහිටා ඇති, ජල විද්‍යාත්මක විශයෙන් එකට බැඳුණු කුඩා හා මධ්‍යම ප්‍රමාණයේ වැව් පද්ධති හෝ වැව් හා අමුණු පද්ධති හෝ අමුණු පද්ධති වලින් සමන්විත, මධ්‍යම ප්‍රමාණයේ ජල පෝෂක ප්‍රදේශයක් (Meso-catchment) ඇල්ලංගා පද්ධතිය ලෙස හැඳින්වේ.

03. ශ්‍රී ලංකාවේ ඇල්ලංගා පද්ධති 1166 ක් දැනට හඳුනාගෙන ඇත. මෙම ඇල්ලංගා පද්ධති ආශ්‍රිතව භූ විද්‍යාත්මක, ජල විද්‍යාත්මක, පරිසර විද්‍යාත්මක සහ සමාජ ආර්ථික ප්‍රගමණය උදෙසා සම්පත් භාවිතය කාර්යක්ෂමව හා තිරසරව පවත්වාගෙන යාම ඉලක්ක කරගනිමින් 1968 අංක 48 දරන වාරිමාර්ග (සංශෝධන) ආඥා පනතින් සංශෝධිත 1946 අංක 32 දරන වාරිමාර්ග ආඥා පනතේ 1 (අ) 1, 2, 3, 4 වගන්ති ප්‍රකාරව ගොවිජන සංවර්ධන කොමසාරිස් ජනරාල් වෙත පැවරී ඇති බලතල අනුව සහ උක්ත පනත යටතේ පවත්වනු ලබන දිස්ත්‍රික් කෘෂිකර්ම කමිටුවේදී වාරි කර්මාන්ත ආශ්‍රිත වී වගාව ඇතුළු කෘෂිකර්මයට බලපාන හෝ අනුෂාංගික සියලු කරුණු සම්බන්ධව කටයුතු කිරීමට උක්ත පනතෙන් ඔබ වෙත පැවරී ඇති බලතල අනුව ඇල්ලංගා පද්ධති කළමනාකරණ කමිටු [Cascade Management Committee (CMC)] පිහිටුවීම හා පවත්වාගෙන යාම සම්බන්ධයෙන් කෘෂිකර්ම කමිටුවේදී සමාලෝචනය කරන ලෙසත් ඊට පහත සඳහන් කරුණු මාර්ගෝපදේශ විශයෙන් යොදාගන්නා ලෙසත් කාරුණිකව දන්වා සිටිමි.

3.1. ඇල්ලංගා පද්ධති කළමනාකරණ කමිටු පිහිටුවීමේ පරමාර්ථ

i. ඇල්ලංගාවක පිහිටි සියලු ස්වාභාවික සම්පත්, එනම් පස, ජලය, වන සම්පත, ජෛව පද්ධති, ඉඩම් හා වාරිමාර්ග පද්ධති කළමනාකරණය කිරීම සඳහා ප්‍රතිලාභීන් සහ අදාළ රාජ්‍ය නිලධාරීන් ඒකාබද්ධ ප්‍රවේශයකින් කටයුතු කිරීම සඳහා ආයතනික ව්‍යුහයක් සකස් කිරීම.

ii. වාරි කෘෂිකර්මය, පශු සම්පත් කටයුතු සහ මිරිදිය ධීවර කර්මාන්තය, සඳහා ජලය සැපයීම, වන සම්පත හා වන ජීවී වාසස්ථාන තුලනාත්මකව පවත්වාගෙන යාම, භූගත ජල මට්ටම ප්‍රශස්ත ලෙස පවත්වාගෙන යාම, ගෙවතු වගාව ඇතුළු ගෘහස්ථ ජල පරිභෝජනයන් පිරිමැසීම ලෙස කළමනාකරණය කිරීම.

ගොවිජන සංවර්ධන දෙපාර්තමේන්තුව, අංක 42, ශ්‍රීමත් මාකස් ප්‍රනාන්දු මාවත, තැ. පෙ. 537, කොළඹ 07.
கமநல அபிவிருத்தித் திணைக்களம், இல. 42, ஸ்ரீ மார்க்கஸ் பெர்னாண்டோ மாவத்தை, த. பெ. 537, கொழும்பு 07

iii. කෘෂිකාර්මික කටයුතු සඳහා ජලය භාවිතා කරන්නන් ඇතුළුව එල්ලංගා පද්ධතිය නඩත්තු කිරීම සඳහා අනෙකුත් පරිශීලකයන්ගේ සහ පාර්ශවකරුවන්ගේ දායකත්වය ලබාගැනීම.

3.2. එල්ලංගා පද්ධති කළමනාකරණ කමිටු පිහිටුවීමේ අරමුණු

i. එල්ලංගා පද්ධති කළමනාකරණය හා තිරසර පැවැත්ම සඳහා නීතිමය පිළිගැනීමක් සහිත ආයතනික ව්‍යුහයක් ඇති කිරීම.

ii. එක් එක් එල්ලංගා පද්ධති වලට අදාළව එහි ක්‍රියාකාරීත්වයට හා තිරසර පැවැත්මට අදාළ වන ගැටළු හා යෝජිත විසඳුම් ඒකාබද්ධ ප්‍රවේශයකින් යුක්තව සාකච්ඡා කර නීතිමය වශයෙන් පිළිගත් ක්‍රමවේදයක් ඇති කිරීම.

iii. එල්ලංගා පද්ධතිය තුළ පිහිටි වාරි කෘෂිකාර්මික, ජල කළමනාකරණ, පාරිසරික, සමාජ ආර්ථික හා භූ විද්‍යාත්මක සාධක පද්ධතියේ මනා ක්‍රියාකාරීත්වය සඳහා අඛණ්ඩව හා සක්‍රියව පවත්වාගෙන යාමට ක්‍රමවේදයක් ඇති කිරීම.

iv. එල්ලංගා පද්ධතියේ සංවර්ධන කටයුතු වලදී, මුළු පද්ධතියට සිදුවන හායනයන් වලක්වා ගනිමින් අවශ්‍යතා තහවුරු කිරීම, ජල සම්පත් කාර්යක්ෂමව පරිහරණය සඳහා වගා කන්න පදනම් කර ගනිමින් සැලසුම් සකස් කිරීම.

v. එල්ලංගා පද්ධතිය සඳහා ඒකාබද්ධ කෘෂිකාර්මික නිෂ්පාදන සැලැස්මක් සකස් කිරීම හා එම සැලැස්මේ ක්‍රියාත්මක තත්ත්වය පසුවිපරම කිරීම.

vi. එල්ලංගා පද්ධතියක පැවතිය යුතු අංගෝපාංග ප්‍රතිස්ථාපනය සඳහා අවශ්‍ය කටයුතු කිරීම.

vii. එල්ලංගා පද්ධති හා බැඳුනු සමාජ ආර්ථික සම්බන්ධතා ආරක්ෂා කිරීම හා ඒ පිළිබඳව පාර්ශවකරුවන් දැනුවත් කිරීම

3.3. එල්ලංගා පද්ධති කලමනාකරණ කමිටුවේ කාර්යභාරය

i. එල්ලංගා පද්ධතිය සඳහා වන සැලසුම් සකස් කිරීම, ක්‍රියාත්මක කිරීම හා පසුවිපරම් කිරීම.

ii. එල්ලංගා පද්ධති කළමනාකරණ කමිටු සාමාජිකයන් විසින් ඉදිරිපත් කරනු ලබන ගැටලු, යෝජනා සහ සැලසුම් සඳහා විසඳුම් ලබාදීම සහ විසඳිය නොහැකි ගැටලු අදාළ වන පරිදි ප්‍රාදේශීය / දිස්ත්‍රික් කෘෂිකර්ම කමිටුව වෙත යොමු කර විසඳා ගැනීම.

iii. එල්ලංගා පද්ධති කලමනාකරණයට අදාල වාර්තාවක් අවස්ථානුකූලව ප්‍රාදේශීය / දිස්ත්‍රික් කෘෂිකර්ම කමිටුව වෙත ඉදිරිපත් කිරීම.

iv. ග්‍රාමීය වැව් එල්ලංගාවන් තුළ පිහිටි සියලුම ජල මූලාශ්‍ර හා ජල පාරිභෝගිකයින් එක්ව එල්ලංගාව අයත් මධ්‍යම ජල පෝෂක ප්‍රදේශය (Meso-Catchment) සඳහා ඒකාබද්ධ කෘෂිකාර්මික සැලැස්මක් පිළියෙල කොට ක්‍රියාත්මක කිරීම.

v. එල්ලංගාවක් තුළ කටයුතු කරන සියලුම ජල පාරිභෝගිකයන්ගේ අවශ්‍යතා අනුව ජල පෝෂක ප්‍රදේශය තුළ පවතින ස්වභාවික සම්පත් කළමනාකරණයට අදාළ තීරණ ගැනීම හා ක්‍රියාත්මක කිරීම.

vi. ස්වභාවික ආපදා, ව්‍යසන හා හානිකර මානව ක්‍රියාකාරකම් අවම කරගැනීමට හැකිවන පරිදි සියලු ජල මූලාශ්‍ර කළමනාකරණය කිරීම.

vii. එල්ලංගාව තුළ පිහිටි සියලු ජල මූලාශ්‍ර ආශ්‍රිත ජල පාරිභෝගිකයන් අතර කාර්යක්ෂම තොරතුරු සන්නිවේදන ක්‍රමයක් ස්ථාපිත කිරීම.

viii. එල්ලංගාව තුළ ඇති පරිසර පද්ධති වලට අදාළ යෙදවුම් හා නිමවුම් ප්‍රශස්ත ලෙස කළමනාකරණය සඳහා විධිමත් ක්‍රමවේදයක් ස්ථාපිත කිරීම.

ix. පවතින හා ඉදිරියේදී ඇතිවිය හැකි බවට අනාවැකි පල කරන දේශගුණික විචලනයන් සඳහා යෝග්‍ය වූ දේශගුණික සුහුරු උපායමාර්ගික සැලසුම් ක්‍රියාවට නැංවීම සහ ජල පාරිභෝගිකයන් එවැනි දේශගුණික අනුගත වීම් වලට හුරු කිරීම.

x. එල්ලංගා පද්ධතිය තුළ ජල පාරිභෝගිකයන් අතර දැනුම, ආකල්ප, කුසලතාවයන් සහ සම්පත් ඵලදායී ලෙස හුවමාරු කරගැනීම.

xi. ජල පාරිභෝගියන්ගේ ඉඩම්, ජලය හා පරිසර පද්ධතිවල ඵලදායීතාවය ඉහළ නැංවීමට කටයුතු කිරීම.

xii. කෘෂිකර්මයට හා ජල පරිභෝජනයට අදාළ වන පරිසර පද්ධති හා සම්බන්ධ සාම්ප්‍රදායික නීති හා පනවන ලද නීති බලාත්මක කිරීමට අවශ්‍ය සහය ලබා දීම.

xiii. ඉඩම් හිමි ගොවීන්ගේ හා බුක්තිකරුවන්ගේ රැස්වීම (වගා කන්න රැස්වීම) පැවැත්වීම සඳහා අවශ්‍ය මූලික තීරණ ගැනීමට ගොවීන්ට සහාය වීම, ඊට අදාල සම්බන්ධීකරණ කටයුතු සිදු කිරීම සහ පසුවිපරම් කිරීම.

xiv. එල්ලංගා පද්ධති බල ප්‍රදේශය තුළ සියලු ජල මූලාශ්‍ර සහ ඊට අනුබද්ධ අනිකුත් පරිසර පද්ධති වල තිරසර බව සඳහා අදාල රාජ්‍ය ආයතනවල මඟ පෙන්වීම හා උපදෙස් අනුගමනය කරමින් සංරක්ෂණය කරවීමට ක්‍රියාමාර්ග ගැනීම.

xv. එල්ලංගා පද්ධතියට හානිකරන පාර්ශවයන්ට එරෙහිව නීතිමය පියවර ගැනීමට අවශ්‍ය කටයුතු කිරීම.

xvi. එල්ලංගා පද්ධතියේ සැම සංවර්ධන ක්‍රියාවලියකදීම ඒ සඳහා ක්‍රියාකාරී ලෙස දායකත්වය ලබාදීම හා ප්‍රගති සමාලෝචනය කිරීම.

xvii. එල්ලංගා පද්ධතියේ වාරි කර්මාන්ත වල කන්න රැස්වීම් තීරණ ක්‍රියාත්මක කිරීමේ තත්ත්වය පසුවිපරම් කිරීම.

xviii. එල්ලංගා පද්ධතියේ වාරි කර්මාන්ත වල මෙහෙයුම් හා නඩත්තු වැඩසටහන පසුවිපරම් කිරීම.

3.4. එල්ලංගා පද්ධති කලමණාකරණ කමිටුවේ සංයුතිය

3.4.1 ප්‍රාදේශීය මට්ටම

මෙම කමිටුව අදාල ප්‍රාදේශීය ලේකම් බල ප්‍රදේශයේ පහත නිලධරයන්ගෙන් සමන්විත වේ.

i. ප්‍රාදේශීය ලේකම්
ii. ගොවිජන සංවර්ධන ප්‍රාදේශීය නිලධාරී
iii. කෘෂිකර්ම උපදේශක
iv. පළාත් වාරිමාර්ග දෙපාර්තමේන්තුව නියෝජනය කරමින් ඉංජිනේරු / තාක්ෂණික නිලධාරී
v. ගොවිජන සංවර්ධන දෙපාර්තමේන්තුව නියෝජනය කරමින් ප්‍රාදේශීය ඉංජිනේරු / තාක්ෂණික නිලධාරී
vi. කෘෂිකර්ම පර්යේෂණ හා නිෂ්පාදන සහකාර
vii. ග්‍රාම නිලධාරී
viii. සමෘද්ධි සංවර්ධන නිලධාරී
ix. ආර්ථික සංවර්ධන නිලධාරී
x. ඉඩම් පරිහරණ හා ප්‍රතිපත්ති සැලසුම් දෙපාර්තමේන්තුවේ නියෝජිතයෙකු
xi. පළාත් ධීවර දෙපාර්තමේන්තුවේ නියෝජිතයෙකු
xii. ජලජීවී වගා සංවර්ධන අධිකාරියේ නියෝජිතයෙකු
xiii. පරිසර අධිකාරියේ නියෝජිතයෙකු
xiv. පොලිස් පරිසර ඒකකයේ නියෝජිතයෙකු
xv. සත්ත්ව නිෂ්පාදන හා සෞඛ්‍ය දෙපාර්තමේන්තුවේ නියෝජිතයෙකු
xvi. කෘෂිකාර්මික හා ගොවිජන රක්ෂණ මණ්ඩලයේ නියෝජිතයෙකු
xvii. වාරි මාර්ග ඉංජිනේරු/තාක්ෂණ නිලධාරී
xviii. වන ජීවී සංරක්ෂණ දෙපාර්තමේන්තුවේ නියෝජිතයෙකු
xix. වන සංරක්ෂණ දෙපාර්තමේන්තුවේ නියෝජිතයෙකු
xx. භූ විද්‍යා හා පතල් කැණීම් කාර්යාංශයේ නියෝජිතයෙකු
xxi. ජාතික ජල සම්පාදන හා ජලපවාහන මණ්ඩලයේ නියෝජිතයෙකු
xxii. පුරාවිද්‍යා දෙපාර්තමේන්තුවේ නියෝජිතයෙකු
xxiii. සිවිල් ආරක්ෂක දෙපාර්තමේන්තුවේ නියෝජිතයෙකු
xxiv. පළාත් පාලන ආයතන නියෝජනය කරමින් බලයලත් නිලධරයකු
xxv. ගොවි සංවිධාන, කාන්තා ගොවි සංවිධාන, නිෂ්පාදන ගොවි සංවිධාන නියෝජනය කරමින් එක් එක් ගොවි සංවිධානයේ සභාපති හෝ ලේකම්
xxvi. ප්‍රජා ජල සංවිධානයක නියෝජිතයෙක්

xxvii. වෙනත් ප්‍රජා සංවිධාන හා පරිසර සංවිධාන නියෝජනය කරමින් එක් සංවිධානයකින් එක් නියෝජිතයෙකු

3.4.2.<u>දිස්ත්‍රික් මට්ටම</u>

මෙම කමිටුව අදාල දිස්ත්‍රික්කයේ පහත නිලධරයන්ගෙන් සමන්විත වේ.

i. දිසාපති හෝ දිස්ත්‍රික් ලේකම්
ii. ප්‍රාදේශිය ලේකම්
iii. ගොවිජන සංවර්ධන නියෝජ්‍ය / සහකාර කොමසාරිස්
iv. පළාත් පාලන ආයතන නියෝජනය කරමින් පළාත් පාලන සහකාර කොමසාරිස් හෝ නියෝජිතයෙකු
v. දිස්ත්‍රික් කෘෂිකර්ම අධ්‍යක්ෂක
vi. පළාත් හා අන්තර් පළාත් නියෝජ්‍ය කෘෂිකර්ම අධ්‍යක්ෂකවරුන්
vii. වාරි මාර්ග අධ්‍යක්ෂක හෝ ප්‍රධාන ඉංජිනේරු
viii. පළාත් වාරිමාර්ග දෙපාර්තමේන්තුව නියෝජනය කරමින් නියෝජ්‍ය අධ්‍යක්ෂක හෝ නියෝජිතයෙකු
ix. ඉඩම් පරිහරණ හා ප්‍රතිපත්ති සැලසුම් දෙපාර්තමේන්තුවේ සහකාර අධ්‍යක්ෂක හෝ දිස්ත්‍රික් භාර නිලධාරි
x. පළාත් ධීවර දෙපාර්තමේන්තුවේ අධ්‍යක්ෂක හෝ නියෝජිතයෙකු
xi. ජලජීවී වගා සංවර්ධන අධිකාරියේ සහකාර අධ්‍යක්ෂක හෝ දිස්ත්‍රික් භාර නිලධාරි
xii. පරිසර අධිකාරියේ දිස්ත්‍රික් සහකාර අධ්‍යක්ෂක හෝ දිස්ත්‍රික් භාර නිලධාරි
xiii. සත්ත්ව නිෂ්පාදන හා සෞඛ්‍ය දෙපාර්තමේන්තුවේ නියෝජ්‍ය අධ්‍යක්ෂක හෝ නියෝජිතයෙකු
xiv. කෘෂිකාර්මික හා ගොවිජන රක්ෂණ මණ්ඩලයේ සහකාර අධ්‍යක්ෂක හෝ නියෝජිතයෙකු
xv. වන ජීවී සංරක්ෂණ දෙපාර්තමේන්තුවේ සහකාර අධ්‍යක්ෂක හෝ දිස්ත්‍රික් භාර නිලධාරි
xvi. වන සංරක්ෂණ දෙපාර්තමේන්තුවේ දිසා වන නිලධාරි හෝ නියෝජිතයෙකු
xvii. ජාතික ජල සම්පාදන හා ජලපවාහන මණ්ඩලයේ දිස්ත්‍රික් භාර නිලධාරි හෝ ඉංජිනේරු
xviii. පුරාවිද්‍යා දෙපාර්තමේන්තුවේ සහකාර අධ්‍යක්ෂක හෝ දිස්ත්‍රික් භාර නිලධාරි
xix. භූ විද්‍යා හා පතල් කැණීම් කාර්යාංශයේ නියෝජිතයෙකු
xx. ගොවිජන සංවර්ධන ප්‍රාදේශිය නිලධාරී
xxi. පොලිස් පරිසර ඒකකයේ ස්ථාන භාර නිලධාරී
xxii. සිවිල් ආරක්ෂක දෙපාර්තමේන්තුවේ නියෝජිතයෙකු
xxiii. දිස්ත්‍රික් ගොවි සංවිධාන බලමණ්ඩලය නියෝජනය කරමින් සභාපති / ලේකම් හෝ නියෝජිතයෙකු
xxiv. ප්‍රජා ජල සංවිධාන භාර නිලධාරි හෝ දිස්ත්‍රික් නියෝජිතයෙකු
xxv. වෙනත් ප්‍රජා සංවිධාන හා පරිසර සංවිධාන වල දිස්ත්‍රික් මට්ටම නියෝජනය කරමින් එක් සංවිධානයකින් එක් නියෝජිතයෙකු

සැ:යු :- එල්ලංගා පද්ධති බලප්‍රදේශ සීමාව තුළ අදාළ ආයතනයේ බල ප්‍රදේශ එකකට වැඩි ගණනක් පවතින අවස්ථාවක දී එම එක් එක් බල ප්‍රදේශය නියෝජනය කරමින් ඉහත අනුව බලයලත් නිලධාරීන් සහභාගී විය යුතුය.

3.5. එල්ලංගා පද්ධති කලමණාකරණ කමිටුවක නිලධාරී මණ්ඩලය - ප්‍රාදේශීය මට්ටම

i. එල්ලංගා පද්ධතියට ප්‍රාදේශීය ලේකම් කොට්ඨාස එකකට වැඩි ගණනක් පවතින අවස්ථාවක දී සහභාගී වන සෑම ප්‍රාදේශීය ලේකම්වරයෙක්ම කමිටුවේ සම සභාපති ලෙස නිල වශයෙන් කටයුතු කළ යුතුය.

ii. එල්ලංගා පද්ධතියට අදාල ගොවිජන සේවා බල ප්‍රදේශයේ ගොවිජන සංවර්ධන ප්‍රාදේශීය නිලධාරී කමිටුවේ ලේකම් ලෙස නිල වශයෙන් කටයුතු කළ යුතුය. එල්ලංගා පද්ධතියට ගොවිජන සේවා බල ප්‍රදේශ එකකට වැඩි ගණනක් පවතින අවස්ථාවන්හි දී වැඩි පෝෂිත අක්කර ගණනක් පවතින බල ප්‍රදේශයේ ගොවිජන සංවර්ධන ප්‍රාදේශීය නිලධාරී ලේකම් ලෙස කටයුතු කළ යුතුය.

iii. කමිටුවේ සභාපතිවරයාගේ උපදෙස් පරිදි ලේකම්වරයා විසින් රැස්වීම් කැඳවීම සිදු කළ යුතුය.

3.6. එල්ලංගා පද්ධති කලමණාකරණ කමිටුවක නිලධාරී මණ්ඩලය - දිස්ත්‍රික් මට්ටම

i. එල්ලංගා පද්ධතියට දිස්ත්‍රික් එකකට වැඩි ගණනක් පවතින අවස්ථාවක දී සහභාගී වන සෑම දිස්ත්‍රික් ලේකම්වරයෙක්ම කමිටුවේ සම සභාපති ලෙස නිල වශයෙන් කටයුතු කළ යුතුය.

ii. එල්ලංගා පද්ධතියට අදාළ දිස්ත්‍රික් නියෝජ්‍ය / සහකාර කොමසාරිස්වරුන් කමිටුවේ ලේකම් ලෙස නිල වශයෙන් කටයුතු කළ යුතුය. එල්ලංගා පද්ධතියට ගොවිජන සේවා බල ප්‍රදේශ එකකට වැඩි ගණනක් පවතින අවස්ථාවන්හි දී වැඩි පෝෂිත අක්කර ගණනක් පවතින දිස්ත්‍රික් නියෝජ්‍ය / සහකාර කොමසාරිස්වරුන් ලේකම් ලෙස කටයුතු කළ යුතුය.

iii. කමිටුවේ සභාපතිවරයාගේ උපදෙස් පරිදි ලේකම්වරයා විසින් රැස්වීම් කැඳවීම සිදු කළ යුතුය.

04. ශ්‍රී ලංකාවේ කෘෂිකර්මාන්තයේ තිරසර බව රඳා පවතින ප්‍රධාන අංගයක් වන ජෛව පද්ධති කළමනාකරණය සඳහා එල්ලංගා වාරිමාර්ග කළමනාකරණය විධිමත් කිරීම සඳහා පිහිටවනු ලබන එල්ලංගා පද්ධති කළමනාකරණ කමිටු [Cascade Management Committee (CMC)] තුළින් අපේක්ෂිත කාර්යභාරය ඉටුකරගැනීම සඳහා ඒකාබද්ධ ප්‍රවේශයකින් කටයුතු කරනු ඇතැයි අපේක්ෂා කරමි.

ඊ.එච්.එම්.එල්.අබේරත්න
ගොවිජන සංවර්ධන කොමසාරිස් ජනරාල්

පිටපත් :-

i. ලේකම්, රාජ්‍ය පරිපාලන, ස්වදේශීය කටයුතු, පළාත් සභා හා පළාත් පාලන අමාත්‍යාංශය
ii. ලේකම්, කෘෂිකර්ම අමාත්‍යාංශය
iii. සියලුම පළාත් ප්‍රධාන ලේකම්වරුන්
iv. විගණකාධිපති, ජාතික විගණන කාර්යාලය
v. පොලිස්පති, ශ්‍රී ලංකා පොලිස් දෙපාර්තමේන්තුව
vi. අධ්‍යක්ෂ ජනරාල්, කෘෂිකර්ම දෙපාර්තමේන්තුව
vii. අධ්‍යක්ෂ ජනරාල්, වාරිමාර්ග දෙපාර්තමේන්තුව
viii. අධ්‍යක්ෂ ජනරාල්, සමෘද්ධි සංවර්ධන දෙපාර්තමේන්තුව
ix. අධ්‍යක්ෂ ජනරාල්, වනජීවී සංරක්ෂණ දෙපාර්තමේන්තුව
x. වන සංරක්ෂක ජනරාල්, වන සංරක්ෂණ දෙපාර්තමේන්තුව

xi. අධ්‍යක්ෂ ජනරාල්, සත්ත්ව නිෂ්පාදන හා සෞඛ්‍ය දෙපාර්තමේන්තුව
xii. අධ්‍යක්ෂ ජනරාල්, ඉඩම් පරිහරණ හා ප්‍රතිපත්ති සැලසුම් දෙපාර්තමේන්තුව
xiii. අධ්‍යක්ෂ ජනරාල්, පුරාවිද්‍යා දෙපාර්තමේන්තුව
xiv. අධ්‍යක්ෂ ජනරාල්, සිවිල් ආරක්ෂක දෙපාර්තමේන්තුව
xv. අධ්‍යක්ෂ ජනරාල්, ජලජීවී වගා සංවර්ධන අධිකාරිය
xvi. අධ්‍යක්ෂ ජනරාල්, මධ්‍යම පරිසර අධිකාරිය
xvii. අධ්‍යක්ෂ ජනරාල්, භූ විද්‍යා හා පතල් කැණීම් කාර්යාංශය
xviii. සභාපති, කෘෂිකාර්මික හා ගොවිජන රක්ෂණ මණ්ඩලය
xix. සමානායාධිකාරී, ජාතික ජල සම්පාදන හා ජලාපවාහන මණ්ඩලය
xx. සියලුම පළාත් ලේකම් වරුන්, පළාත් කෘෂිකර්ම අමාත්‍යාංශය
xxi. ලේකම්, පළාත් වාරිමාර්ග අමාත්‍යාංශය
xxii. සියලුම පළාත් කෘෂිකර්ම අධ්‍යක්ෂකවරුන්, පළාත් කෘෂිකර්ම දෙපාර්තමේන්තුව
xxiii. සියලුම පළාත් සත්ව නිෂ්පාදන හා සෞඛ්‍ය අධ්‍යක්ෂකවරුන්, පළාත් සත්ත්ව නිෂ්පාදන හා සෞඛ්‍ය දෙපාර්තමේන්තුව
xxiv. ව්‍යාපෘති අධ්‍යක්ෂකවරුන් - CSIAP/ CRIWMP/ SARP
xxv. සියලුම ගොවිජන සංවර්ධන නියෝජ්‍ය/සහකාර කොමසාරිස් වරුන්

(කාරුණික දැනගැනීමට සහ අවශ්‍ය කටයුතු සඳහා)

2 එල්ලංගා පද්ධති කළමනාකරණ කමිටු පිහිටුවීම පිළිබඳ කෘෂිකර්ම අමාත්‍යාංශ ලේකම් විසින් නිකුත් කල ලිපිය

කෘෂිකර්ම අමාත්‍යාංශය
கமத்தொழில் அமைச்சு
Ministry of Agriculture

80/5 ,"ගොවිජන මන්දිරය", රජමල්වත්ත පටුමග, බත්තරමුල්ල, ශ්‍රී ලංකාව.
80/5, "கொவிஜன மந்திரய",ராஜமல்வத்தை ஒழுங்கை,பத்தரமுல்லை, இலங்கை.
80/5 ,"Govijana Mandiraya", Rajamalwatta Lane, Battaramulla, Sri Lanka.

මගේ අංකය. / எனது இல. / My No.	8/1/1/5/CSIAP/Cascade Mgt.	ඔබේ අංකය. / உமது இல. / Your No.	
දිනය. / திகதி. / Date.	2022.07. 21		

ප්‍රධාන ලේකම්/උතුරු මැද , වයඹ, දකුණ, ඌව, උතුර හා නැගෙනහිර පළාත,
දිස්ත්‍රික් ලේකම්/අනුරාධපුර, පොලොන්නරුව, මුලතිව්, කිලිනොච්චිය, වවුනියාව, ත්‍රිකුණාමලය, මඩකලපුව, අම්පාර, කුරුණෑගල, මොනරාගල, හම්බන්තොට,
කොමසාරිස් ජනරාල්, ගොවිජන සංවර්ධන දෙපාර්තමේන්තුව,
වන සංරක්ෂක ජනරාල් , වන සංරක්ෂණ දෙපාර්තමේන්තුව,
අධ්‍යක්ෂ ජනරාල්, වනජීවී සංරක්ෂණ දෙපාර්තමේන්තුව,
අධ්‍යක්ෂ ජනරාල්, වාරි මාර්ග දෙපාර්තමේන්තුව,
අධ්‍යක්ෂ ජනරාල්, භූ විද්‍යා හා පතල් කැනීම් කාර්යාංශය,
සභාපති, ජාතික ජලසම්පාදන හා ජලාපවහන මණ්ඩලය,

දේශගුණ සුහුරු වාරි කෘෂිකර්ම ව්‍යාපෘතිය යටතේ එල්ලංගා පද්ධති කළමනාකරණ කමිටු පිහිටුවීම

උපරිම කාර්යක්ෂමතාවයකින් යුක්තව ජලය පරිහරණය කිරීම හා සම්පත් කළමනාකරණය සඳහා, හැකි සෑම විටම එක වැවකින් අනෙක් වැවට ජලය ලබා ගත හැකි වන ආකාරයට වාරිමාර්ග ඉදිකර ඇති, කිසියම් ජල ද්‍රෝනියක එකිනෙකට සම්බන්ධිත වැව් පද්ධතියක් **එල්ලංගා** ලෙස හඳුන්වනු ලබයි. මෙවැනි එල්ලංගා පද්ධතියක් එම පරිපාලන බල ප්‍රදේශය තුල කටයුතු කරන සියලු ආයතන හා ප්‍රතිලාභින් එක්ව ඒකාබද්ධ ප්‍රවේශයකින් යුක්තව කළමනාකරණය කල යුතු වුවද, වර්තමානයේ එම සංකල්පයෙන් බැහැරව එක් එක් ආයතන විසින් වෙන් වෙන්ව විවිධ සංවර්ධන කටයුතු සිදු කරන බව පෙනේ. මේ නිසා පද්ධතියේ පිහිටි පොදු සම්පත් හායනයට ලක් වූ අතර එහි ප්‍රතිපලයක් ලෙස වැව් ආශ්‍රිත පරිසර පද්ධතිය ක්‍රමානුකූලව විනාශයට පත් විය.

කෘෂිකර්ම අමාත්‍යාංශය විසින් ලෝක බැංකු ණය ආධාර මත ක්‍රියාත්මක කරනු ලබන දේශගුණ සුහුරු වාරි කෘෂිකර්ම ව්‍යාපෘතිය යටතේ ක්‍රියාත්මක කරනු ලබන සියලුම සංවර්ධන කටයුතු එල්ලංගා පද්ධති මූලික කර ගනිමින් සිදුකිරීමට කටයුතු සැලසුම් කර ඇත. මෙම ප්‍රවේශය උක්ත ව්‍යාපෘතිය මගින් නැවත හඳුන්වාදීමට කටයුතු කරනු ලැබුවද සියලුම වාරි කර්මාන්ත ආශ්‍රිත සම්පත් කළමනාකරණය සඳහා මෙන්ම එල්ලාංගාවක තිරසාර පැවැත්ම සඳහා ද මෙම ප්‍රවේශය යොදා ගැනීම ඉතාමත් වැදගත් වන බව නිරීක්ෂණය කරමි. එබැවින් මෙම සංකල්පය දේශගුණික සුහුරු වාරි කෘෂිකර්ම ව්‍යාපෘතිය යටතේ ක්‍රියාත්මක වන එල්ලංගා පද්ධතිවලට හඳුන්වා දී ඒ තුලින් ලබාගන්නා අත්දැකීම් පදනම් කරගෙන දිවයිනේ අනෙකුත් ප්‍රදේශ වලට ද ව්‍යාප්ත කිරීමට මෙම අමාත්‍යාංශය විසින් යෝජනා කෙරේ.

තවද, එල්ලාංගාවක පිහිටි සියලු ස්වභාවික සම්පත්, එනම් පස, ජලය, වන සම්පත්, ඉඩම්, ඒකාබද්ධ ප්‍රවේශයකින් යුක්තව කළමනාකරණය කිරීම සඳහා ප්‍රතිලාභීන්ගෙන් සහ අදාළ රාජ්‍ය නිලධාරීන්ගෙන් සමන්විත එල්ලංගා පද්ධති කළමනාකරණ කමිටු පිහිටුවීමට ව්‍යාපෘතිය අපේක්ෂා කරයි. මෙම එල්ලංගා පද්ධති කළමනාකරණ කමිටු මගින් මූලික වශයෙන් පහත කාර්යන් ඉටුකර ගැනීමට අපේක්ෂා කරයි.

ලේකම් දුරකථන தொலைபேசி Telephone - 011-2034340
செயலாளர் ඊ-මේල් மின்னஞ்சல் e- mail - secretary@agrimin.gov.lk
Secretary ෆැක්ස් தொலைநகல் Fax - 011-2863497

කාර්යාලය දුරකථන தொலைபேசி Telephone - 011-2034300
அலுவலகம் ඊ-මේල් மின்னஞ்சல் e- mail - info@agrimin.gov.lk
Office ෆැක්ස් தொலைநகல் Fax - 011-2868910

I. බල ප්‍රදේශයේ සියලුම ආයතන හා ප්‍රතිලාභීන් එක්ව ඒකාබද්ධ ප්‍රවේශයකින් යුක්තව එල්ලංගාවේ සම්පත් කළමනාකරණය කිරීම සඳහා අවශ්‍ය තීරණ ගැනීම, එම තීරණ ක්‍රියාත්මක කිරීමේ තත්වය පසු විපරම් කිරීම හා ඒ අනුව අවශ්‍ය නිවැරදි කිරීම් සිදු කිරීම
II. බල ප්‍රදේශයේ සම්පත් පරිහරණය කරනු ලබන විවිධ පාර්ශව අතර සහජීවනය ගොඩ නැගීම.
III. පද්ධතියේ සිදුවන සම්පත් හායනය වළක්වා ගැනීමට කටයුතු කිරීම
IV. පද්ධතියේ ජල සම්පත් කාර්යක්ෂමව පරිහරණය සඳහා සෑම කන්නයකම පෙර කන්න රැස්වීමක් පැවැත්වීම.
V. බල ප්‍රදේශය සඳහා කෘෂිකර්ම නිෂ්පාදන සැලැස්මක් සැකසීම හා එම සැලැස්ම ක්‍රියාත්මක කිරීමේ තත්වය පසු විපරම් කිරීම.
VI. කන්න රැස්වීම් තීරණ ක්‍රියාත්මක කිරීමේ තත්වය පසුවිපරම් කිරීම.
VII. වැව් මට්ටමින් ක්‍රියාත්මක වාරිමාර්ග නඩත්තු කටයුතු වල තත්වය පසු විපරම් කිරීම.
VIII. ජල ධාරා ප්‍රදේශ කළමනාකරණය සඳහා වැඩසටහන් හඳුන්වා දීම හා ඒ පිළිබඳ පසුවිපරම් කිරීම.
IX. මාසිකව පැවැත්වෙන ප්‍රාදේශීය කෘෂිකර්ම කමිටුවට වාර්තාවක් ඉදිරිපත් කිරීම.

එබැවින් එල්ලංගා පද්ධතිය තුලට අයත් බල ප්‍රදේශයේ සියලු රාජ්‍ය හා පෞද්ගලික ආයතන සහ ප්‍රතිලාභීන් එල්ලංගා පද්ධති කළමනාකරණයට දායක කරවා ගැනීම සඳහා අවස්ථානුකූලව පහත ආයතන වල නියෝජිතයන්ගෙන් සමන්විත එල්ලංගා පද්ධති කළමනාකරණ කමිටුවක් පිහිට වීමට තීරණය කර ඇත.

I. බල ප්‍රදේශයේ ප්‍රාදේශීය ලේකම්ගේ නියෝජිතයෙකු
II. ගොවිජන සංවර්ධන ප්‍රාදේශීය නිලධාරී
III. බල ප්‍රදේශයේ අන්තර් පළාත් හෝ පළාත් කෘෂිකර්ම දෙපාර්තමේන්තුවල සේවය කරනු ලබන කෘෂිකර්ම උපදේශකවරු
IV. පළාත් වාරිමාර්ග දෙපාර්තමේන්තුව නියෝජනය කරමින් තාක්ෂණික නිලධාරියකු
V. බල ප්‍රදේශයේ වාරි මාර්ග ඉංජිනේරුගේ නියෝජිතයකු (වාරිමාර්ග දෙපාර්තමේන්තුව යටතට ගැනෙන වැව් බල ප්‍රදේශයට අයත් නම්)
VI. වනජීවී සංරක්ෂණ දෙපාර්තමේන්තුව නියෝජනය කරමින් නියෝජිතයකු
VII. වන සංරක්ෂණ දෙපාර්තමේන්තුව නියෝජනය කරමින් නියෝජිතයකු
VIII. භූ විද්‍යා හා පතල් කැණීම් කාර්යංශයේ නියෝජිතයකු
IX. ජාතික ජලසම්පාදන හා ජලාපවහන මණ්ඩල නියෝජිතයකු
X. පළාත් පාලන ආයතන (ප්‍රාදේශීය සභා) නියෝජනය කරමින් නියෝජිතයකු
XI. බල ප්‍රදේශයේ පිහිටි ගොවි සංවිධාන නියෝජනය කරමින් එක් ගොවි සංවිධානයකින් එක් අයෙකු බැගින් (සභාපති හෝ ලේකම් යන දෙදෙනාගෙන් එක් අයෙකු)
XII. බල ප්‍රදේශයේ පිහිටි ග්‍රාමීය කමිටු නියෝජනය කරමින් එක් කමිටුවකින් එක් නියෝජිතයකු බැගින්
XIII. බල ප්‍රදේශයේ පිහිටි අනෙකුත් ප්‍රජා සංවිධාන නියෝජනය කරමින් එක් අයෙකු

ඒ අනුව, දේශගුණික සුහුරු වාරි කෘෂිකර්ම ව්‍යාපෘතිය යටතේ එල්ලංගා පද්ධති මට්ටමින් පිහිටුවන ලබන එල්ලංගා පද්ධති කළමනාකරණ කමිටු සාමාජිකයින් ලෙස නම් කර ඇති ඔබ දෙපාර්තමේන්තුවේ අදාල නිලධාරීන් සහභාගි කරවීමට අවශ්‍ය කටයුතු සිදු කරන ලෙසත්, මෙම කමිටු පිහිටුවීම සඳහා අවශ්‍ය සහය ලබාදෙන ලෙස ඔබ දෙපාර්තුමේන්තුවේ නිලධාරීන් දැනුවත් කරන ලෙසත් කාරුණිකව දන්වමි.

එම්. බී රෝහන පුෂ්පකුමාර්
ලේකම්
කෘෂිකර්ම අමාත්‍යාංශය

පිටපත : ව්‍යාපෘති අධ්‍යක්ෂ, දේශගුණ සුහුරු වාරි කෘෂිකර්ම ව්‍යාපෘතිය

3. උපව්‍යාපෘති ආකෘතිපත්‍රය

(මෙහි සිංහල පරිවර්තනය පසුව ඇතුලත් කරනු ලැබේ.)

Format for preparing a Subproject Proposal (SPPs) to obtain funds for implementation of interventions.

1. Administrative Details:

No	Matters	Details
1	Contact details of proposal submitting agency: (postal, e-mail, telephone etc	
2	Contact Details of the implementing agency: (postal, e-mail, telephone etc.)	
3	Contact details with the position of the person responsible for providing information of the proposal (e-mail, telephone – land/mobile:	
4	Sector of the proposal (rehabilitation of tanks/catchment treatment/agriculture practices/ marketing/ institutional development/technology transferring/training/other (specify etc.).	
5	Ref. no of the concurrence of the Divisional Agriculture Committee (DAC).	

2. Sub-Project Details:

2.1. Title of the Sub-Project (Please note that the name may be very similar to that of the project development objective, but not in all time):

………………………………………………………………………………………………

2.2. Summary of the sub-project (please give a very brief paragraph answering the questions of what it is, why it is, who it is, where it is and when it is implemented? The estimated total cost is also needed).

…………………………………………………………………………………………………

2.3. Project Location (details such as cascade, Agrarian Service Centre, Local Government Ward, GN Division etc. If the project location is considered as a highly vulnerable area to flood or drought, please indicate that too).

…………………………………………………………………………………………………

2.4. Project issue/rational/justification (This is very important and is considered as the main part of the proposal. Therefore, please highlight what the issue, how it is impacted on the farmers, how it was identified and what bad effects would happen, if it is not resolved).

…………………………………………………………………………………………………

2.5. How the critical issue was identified? (through community consultations, requests from farmer organisations, cascade management plan etc.).

…………………………………………………………………………………………………

2.6. Objective of the sub-project (please formulate this in very rational manner since it is important for the monitoring purpose).

…………………………………………………………………………………………………

2.7. Specific Objectives (Specific objectives need to be developed according to SMART form and this is also very important for the monitoring purpose.

1.

2.

2.8. Proposed sub- project activities (This part needs to be described very rationally and what actions the implementing agency proposed to address the critical issue and how it contributes to achieve the project objective?

…………………………………………………………………………………………………

2.9. Expected results (these may be economic, political, social, environment, cultural, nutritional etc.).

1.

2.

2.10. Beneficiaries (The nature of the beneficiaries – In addition to number of male and female, please indicate other characteristics also such as belonging to low-income or indigenous groups, affected by war etc.).

…………………………………………………………………………………………………

2.11. Who of the beneficiaries will participate in implementation?

2.12. How do women get benefited?

…………………………………………………………………………………………………

2.13. Who will be responsible for operation and maintenance (O&M) including estimated cost for O&M?

…………………………………………………………………………………………………

2.14. Potential Risks and strategies propose to minimize the risks

2.15. Does the project fall either under the negative list or prescribed list?

(a) If, Yes, please explain whether IEE or EIA is required.

…………………………………………………………………………………………………

(b) If No, IEER/EIS format will be required.

2.16. Name/names of the proposed farmer organizations or producer organizations that could be got involved in implementing the sub-project (if applicable, details need to be annexed).

…………………………………………………………………………………………………

3. Implementation methodology

3.1. How the project is planned to be implemented and with what stakeholders etc? (describe with adequate details).

……………………………………………………………………………………………………

3.1. Tendering process (explain how it is planned to procure required materials).

3.2. Activity plan (describe the activity plan with the time frame and the responsible agencies/persons in implementation. This need to be describe using a Gantt chart).

4. Subproject Monitoring Mechanism: (This is very important. Therefore, please describe how the monitoring activities are taken place providing adequate details).

....

5. Subproject Evaluation Mechanism: (please indicate how the implementing agency plans to evaluate the project and at what intervals).

……………………………………………………………………………………………………

6. Reporting arrangement (please describe who will take the responsibility of making both financial and progress reporting and also the expected time period).

7. Estimated Cost:

No	Major Activity	Total estimated cost in LKR	Community Contribution (LKR)	Other sources(specify) (LKR)	Amount expected from donor agency (LKR)
1					
2					

8. Submission

8.1. Authorized person to submit the sub-project proposal on behalf of the Cascade Management Committee (CMC).

8.2. Position, contact details, frank, date of submission

09. Annexes:

(please annex all relevant additional details to provide adequate information to justify the subproject proposal and thereby to expedite the approval process.